ඇමුණුම I

# 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

ආයතනයේ නම - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

වැයශීර්ෂ අංකය -120-01-02-2201


| අන්තර්ගතය | පිටු සංඛ්‍යාව |
| --- | --- |
| පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 2 - 09 |
| පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 10 -54 |
| පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 55 - 83 |
| පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක | 84 - 84 |
| පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 84 -86 |
| පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ | 86 - 89 |
| පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව | 89 - 95 |

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේදී ළමයින් සම්බන්ධයෙන් පවතින නීති පද්ධතිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. දැයේ ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේදීත් ක්‍රියාත්මක විය.

1989 නොවැම්බර් 20 වන දින "එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය විශ්ව ප්‍රකාශනයක්"ලෙස සම්මත කර ගන්නා ලදී.මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. වර්ෂ 2000 දී ළමා අයිතිවාසිකම් සම්මුතියේ අන්තර්ගතයට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදී.1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය.ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටවනු ලැබීය.එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.ඒ අනුව1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.1998 නොවැම්බර් මාසයේදී මෙම පනත්කෙටුම්පත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මතවිය.ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1999 ජූනි මාසයේදී අධිකාරියේ සභාපති හා පාලක සභාව පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිටම වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන්හිදී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින් ද අධිකාරිය වෙත බලතල හිමිව පවතියි. තවද 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදු කළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනමව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන

විට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ සිදුවීම් මෙම සේවය හරහා වාර්තා වන අතර, ළමුන් සඳහා උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් 2020 වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළකාර්යයන් සිදු කර ඇත.

### 1.2 ආයතනයේ දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

**මෙහෙවර**

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

### 1.3 ප්‍රධාන කාර්යයන්

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. එම කාර්යභාරය පහත සඳහන් කර ඇත.(වගන්ති 14 ප්‍රකාරව)

(අ) ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.

(ආ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.

(ඇ) එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවටඋපදෙස් දීම.

(ඈ) අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

(ඉ) ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.

(ඊ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.

(උ) සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.

(ඍ) ළමා අපයෝජන  හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.

(එ) සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ගැනීම ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම.

(ඒ) අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.

(ඔ) ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදි ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.

(ඕ) ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත්  සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.

(ක) ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

(ග) අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.

(ච) ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(ජ) ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.


(ට) ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.

(ඩ) ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

(ණ) සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ රජයන් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

1.4 සංවිධාන ව්‍යුහය

**2020 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය**



## 2020 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | රාජකාරී කරන ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|
| 01 | මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා | සභාපති (2020 ජනවාරි 01 වෙනිදා සිට) | අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය,අධිකරණ වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, නුගේගොඩ |
| 02 | නීතිඥ සුජාතා අලහප්පෙරුම මහත්මිය | නියෝජ්‍ය සභාපති (2020 ජනවාරි 01 වෙනිදා සිට) | විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු |
| 03 | හේමමාල් කස්තුරිආරච්චි මහතා (නිරීක්ෂක) | අධ්‍යක්ෂ ජනරාල් (2020 ඔක්තෝබර් මස සිට) | මුදල් අමාත්‍යාංශය ,ලෝටරීස් පාර, කොළඹ |
| 04 | වෛද්‍ය ස්වර්ණා විජේතුංග මහත්මිය | ජ්‍යෙෂ්ඨ මනෝ වෛද්‍ය විශේෂඥ (ළමා සහ යෞවන) (2020 ජනවාරි මස සිට) | රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල |
| 05 | වෛද්‍ය සේනක ගුණතිලක මහතා | ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ වෛද්‍ය (2020 ජනවාරි මස සිට) | දිස්ත්‍රික් රෝහල, බදුල්ල |
| 06 | - | සායනික මනෝවිද්‍යාඥ (පුරප්පාඩු වේ) | - |
| 07 | ජේ.ඒ.ඩී.එම්.පී.එන්. ජයකොඩි මහතා | නියෝජ්‍ය පොලිස්පති (2020 මාර්තු මස සිට ) | පොලිස් දෙපාර්තමේන්තුව, 331, ඕල්කට් මාවත , කොළඹ |
| 08 | සුසන්ත බාලපටබැඳි මහතා | අතිරේක සොලිසිටර් ජනරාල් (2020 ජූනි මස සිට) | නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12 |
| 09 | චන්ද්‍රානී සේනාරත්න මහත්මිය | ලේකම් (2020 ජනවාරි මස සිට) | ජාතික වැටුප් කොමිසම කාමර අංක 2 – 116 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07 |
| 10 | වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය | ස්වාධීන ළමා අයිතිවාසිකම් පිළිබඳ උපදේශක (2020 ජනවාරි මස සිට) | - |
| 11 | ආචාර්ය කපිල බණ්ඩාර මහතා | පීඨාධිපති අධ්‍යාපන පීඨය | අධ්‍යාපන පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| | | කොළඹ විශ්වවිද්‍යාලය (2020 ජනවාරි මස සිට) | 94 කුමාරතුංග මුණිදාස මාවත කොළඹ 07 |
| 12 | උදයකුමාර අමරසිංහ මහතා | අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (2020 ජනවාරි මස සිට) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ගංගොඩවිල නුගේගොඩ |
| 13 | චන්දිමා සිගේරා මහත්මිය | කොමසාරිස් (2020ජනවාරි මස සිට) | පරිවාස හා ළමාරක්ෂකසේවා දෙපාර්තමේන්තුව, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| 14 | ඒ. විමලවීර මහතා<br><br>බී.කේ. චන්ද්‍රකීර්ති මහතා | කම්කරු කොමසාරිස් ජනරාල් (2020 ජනවාරි මස සිට ඔක්තෝබර් දක්වා) (2020නොවැම්බර් සිට) | කම්කරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, කොළඹ 05 |
| 15 | සුජීවා පල්ලියගුරුගේ මහත්මිය | අධ්‍යක්ෂ (සංවර්ධන)<br><br>(2020ජනවාරි මස සිට) | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

## 2020 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| අනු අංකය | මූල මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | රාජකාරී කරන ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|
| 01 | හසිනි පල්ලාවල මහත්මිය | ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (පරිපාලන) (2020 මැයි මස සිට) | ආරක්ෂක අමාත්‍යාංශය 15/5, බෞද්ධාලෝක මාවත, කොළඹ 03 |
| 02 | පී.ජේ.ඩී.ප්‍රනාන්දු මහත්මිය | ජ්‍යෙෂ්ඨසහකාර ලේකම් (2020 ජූනි මස සිට) | සමාජසේවා අමාත්‍යාංශය, සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| 03 | එන්.ඒ.කේ. විජේනායක මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br><br>(2020 ජූනි මස සිට) | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |
| 04 | රෝෂිණී හෙට්ටිගේ මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br><br>(2020 ජූනි මස සිට) | අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය, අධිකරණ මාවත, කොළඹ 01 |
| 05 | එම්.සී.එස්.දේවසුරේන්ද්‍ර මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)<br><br>(2020 මැයි මස සිට) | තොරතුරු හා ජනමාධ්‍ය, අමාත්‍යාංශය, 163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 |

| | | | |
|---|---|---|---|
| 06 | කේ.පී.එන්.ටී.එන්. දේවප්‍රිය මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන i) (2020 ජූනි මස සිට) | අධ්‍යාපන අමාත්‍යාංශය, පන්නිපිටිය මාවත, ඉසුරුපාය බත්තරමුල්ල |
| 07 | මාධවී ගුණවර්ධන මහත්මිය | කොමසාරිස් (කාන්තා හා ළමා අංශය) (2020 මැයි මස සිට) | කම්කරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, කොළඹ 05 |
| 08 | වෛද්‍ය එච්.එස්.ආර්. පෙරේරා මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සේවා ii) ( 2020ජූනි මස සිට) | සෞඛ්‍ය සහ දේශිය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, 385, බද්දේගම විමලවංස තෙර මාවත, කොළඹ 10 |
| 09 | සී.එච් ගමගේ මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( 2020 ජූනි මස සිට) | සංචාරක අමාත්‍යාංශය, 2 වන මහළ, 51 B, යෝර්ක් විදිය, කොළඹ 01 |
| 10 | - | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය(පුරප්පාඩු වේ) | - |

## 2020 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත අංශ ක්‍රියාත්මක වේ.

1. සභාපති හා නියෝජ්‍ය සභාපති කාර්යාලය
2. අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3. පරිපාලන හා මානව සම්පත් අංශය
4. මූල්‍ය අංශය
5. සැලසුම් හා තොරතුරු අංශය
    - 5.1.1 සැලසුම් හා නියාමන ඒකකය
    - 5.1.2 තොරතුරු හා මාධ්‍ය ඒකකය
        - පුස්තකාලය
6. වැඩසටහන් අංශය
7. මනෝසමාජීය අංශය
8. නීති අංශය
9. නීතිය බලාත්මක කිරීමේ අංශය
    - 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය
    - මධ්‍යම ලේඛනාගාරය
    - වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
    - අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය
10. අභ්‍යන්තර විගණන අංශය

11. විශේෂ පොලිස් විමර්ශන ඒකකය

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ

ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම්

කාර්යාල

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් නිලධාරීන් යොදවා ඇත. පහත දක්වා ඇති පරිදි නිලධාරීන් අනුයුක්ත කර ඇත.

| අනු අංකය | තනතුරු නාමය | දිස්ත්‍රික් ලේකම් කාර්යාල25 සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී | නිලධාරීන් - 25 | - |
| 02 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී | නිලධාරීන් - 25 | - |
| 03 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී | නිලධාරීන්- 25 | - |
| 04 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී | - | නිලධාරීන් 331 |
| 2020 දී අනුමත මුළු නිලධාරීන් සංඛ්‍යාව | | 406 | |

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතන / අරමුදල්

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මෙම ආකාරයෙන් අරමුදල් භාවිතා නොකරයි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘති - 01

අ) ව්‍යාපෘතියේ නම - 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිත ආයතනය - සාර්ක් අරමුදල

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රුපියල් මිලියන7.650

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2020 (වසර 01 යි)

ව්‍යාපෘති - 02

අ) ව්‍යාපෘතියේ නම - ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිත ආයතනය - සේව්ද චිල්ඩ්‍රන් ආයතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රුපියල් මිලියන 1.956

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2020 (වසර 01 යි)

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2020 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ක්‍රියාකාරී සැලසුම් 3 ක් යටතේ ක්‍රියාත්මක විය. ඒ සඳහා පහත සඳහන් ආකාරයට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

1. ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුම (රුපියල් මිලියන 38)
2. 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ක්‍රියාකාරි සැලසුම (රුපියල් මිලියන7.650)
3. ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලසුම (රුපියල් මිලියන 1.956 )

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කළ යුතු කාර්යභාරය 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිපනත මගින් බලාත්මක කර ඇත. ඒ අනුව කාර්යභාරය සිදු කිරීම සඳහා විෂයානුබද්ධව අංශ වෙන් කර ඇත. මෙම අංශ වෙතින් ශ්‍රී ලාංකේය ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කරනු ලබයි.රටේ සියලු ළමුන්ට ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුව හිමිවිය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම්වලට ඇති හිමිකම් සහතික කෙරේ.

ළමුන් කායික දණ්ඩනයට, මානසික පීඩනයට, ලිංගික සහ වෙනත් ආකාරයේ අපයෝජනයට, නීති විරෝධී වාණිජ කටයුතු සඳහා ළමයින් යොදා ගැනීමට (Child Trafficking)ළමා ශ්‍රමිකයන් ලෙස භාවිත කිරීමට සහ නොසලකා හැරීමට බඳුන්වීම මුළුමනින්ම තුරන් කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසල් යටිතලපහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය සහ ඊට අදාළ සියලු ආයතන සමඟ ජාතික ළමා ආරක්ෂක එක්ව ක්‍රියාවට නංවනු ලැබේ.

පෙර පාසල්, දිවාසුරැකුම් මධ්‍යස්ථාන සහ පාසල්වලදී ළමුන් කිසිදු ආකාරයේ වෙනස්කමකට භාජනය කිරීම, කායික දණ්ඩනයට හෝ ලිංගික අපයෝජනයට ලක් කිරීම මුළුමනින්ම වැළැක්වීම සඳහා පුළුල් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාලාව සකස් කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පසුගිය වසර ගණනාවක ළමුන් සම්බන්ධ සියලු නඩු විසඳීම කඩිනම් කිරීම සඳහා සෑම දිස්ත්‍රික් අධිකරණයකම කොටසක් වෙන් කිරීමට රජයට උපදෙස් ලබාදෙන ලදී.

කවර හේතුවක් නිසා හෝ ළදරුවන් මහමඟ දමා යාම, මරා දැමීම වැළැක්වීමට එම දරුවන් දරුකමට හදාවඩා ගැනීම සඳහා ඇති සංකීර්ණ ක්‍රමවේදය සරල කරන සියළුම ළමා නිවාසගත දරුවන්ට **"කැපකාර පවුල"** හඳුන්වාදීමේ ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීමට මූලික සංකල්පය සකස් කර අධිකරණ ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළව ළමයින් සම්බන්ධයෙන් හඳුනාගත් අරමුණු අතර, ( SDG 4) පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම. ( SDG 5)ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාව ළඟාකර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.(SDG 8) සියලු දෙනා සඳහා පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.(SDG 10 - 01) අසාධාරණ හා නොගැලපෙන නීති ප්‍රතිපත්ති තුරන් කරමින් යෝග්‍ය නීති ප්‍රතිපත්ති ඇති කිරීම. (SDG 16)තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා සියලු දෙනාම ඇතුළත්වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම ,සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම හා ඵලදායී වගකීමක් සහිත පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම, යන අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් 03 මගින් කටයුතු කරන ලදී.

**2020 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු**


| අංකය | තනතුර | වැටුප් - කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM -2-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | HM -1-3 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ- පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | 01 | - |
| 05 | අධ්‍යක්ෂ- නීති | HM -1-1 | 01 | - | 01 |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | - | 01 |
| 07 | අධ්‍යක්ෂ -සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | HM -1-1 | 01 | - | 01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ - නීති | MM -1-1 | 01 | 01 | - |
| 12 | සහකාර අධ්‍යක්ෂ- වැඩසටහන් | MM -1-1 | 01 | 01* | - |
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා | MM -1-1 | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය හා තොරතුරු | MM -1-1 | 01 | - | 01 |
| 16 | සහකාර අධ්‍යක්ෂ- නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | - | 01 |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01** | - |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 | - |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM - 1-1 | 01 | 01 | - |
| 20 | පරිපාලන නිලධාරි | JM - 1-1 | 01 | 01 | - |
| 21 | වැඩසටහන් නිලධාරි | JM - 1-1 | 01 | - | 01 |
| 22 | ගිණුම් නිලධාරි | JM - 1-1 | 01 | 01 | - |
| 23 | විමර්ශන නිලධාරි | JM - 1-1 | 01 | 01 | - |
| 24 | මාධ්‍ය හා තොරතුරු නිලධාරි | JM - 1-1 | 01 | - | 01 |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 26 | පර්යේෂණ හා සුභසාධන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 27 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 28 | පරිවර්තක - (ඉංග්‍රීසි) | MA - 4 | 01 | - | 01 |
| 29 | පරිවර්තක (දමිළ) | MA - 4 | 01 | - | 01 |
| 30 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 | 18 | 07 |
| 31 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 | 14 | 11 |
| 32 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 360 | 237 | 123 |
| 33 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 | - |
| 34 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 02 | 01 |
| 35 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 36 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | - | 01 |
| 37 | සැලසුම් සහකාර | MA - 3 | 01 | 01 | - |
| 38 | නීති සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 39 | විමර්ශන සහකාර | MA - 3 | 02 | - | 02 |
| 40 | උපදේශන සහකාර | MA - 3 | 08 | 03 | 05 |
| 41 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 | 02 |

| අංකය | තනතුර | වැටුප් - කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 42 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 43 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 | - | 01 |
| 44 | චිකිත්සක | MA - 3 | 03 | 01 | 02 |
| 45 | වීඩියෝ තාක්ෂණ සහකාර | MA – 2-1 | 03 | 01 | 02 |
| 45 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 | 09 | 06 |
| 46 | තොරතුරු තාක්ෂණ සහකාර | MA – 2-1 | 02 | 02 | - |
| 47 | කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 | 24 | 08 |
| 48 | කළමනාකරණ සහකාර (යතුරු ලියනය - සිංහල) | MA – 1-1 | 03 | - | 03 |
| 49 | කළමනාකරණ සහකාර (යතුරු ලියනය - දමිළ) | MA – 1-1 | 03 | - | 03 |
| 50 | කළමනාකරණ සහකාර තාක්ෂණික - නොවන (සෝදුපත් බැලීම - සිංහල) | MA – 1-1 | 03 | - | 03 |
| 51 | කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (සෝදුපත් බැලීම - දමිළ) | MA – 1-1 | 03 | - | 03 |
| 52 | රියදුරු | PL 3 | 07 | 06 | 01 |
| 53 | පණිවිඩකරු | PL-1 | 01 | - | 01 |
| 54 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 02 | 01 |
| 55 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 | 01 |
| මුළු සංඛ්‍යාව | | | **548** | **344** | **204** |

***	මුදල් අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත.**
****	සේවය අත්හිටුවා ඇත.**

## ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මුද්‍රණය කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්තව්‍යක් වන ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත සඳහා 2019.10.29වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව 2020 වර්ෂයේ දී ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ පිටපත් 2,000 ක් ත්‍රෛභාෂිකව මුද්‍රණය කරන ලදී.



## ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (National Policy on Child Protection) ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතට අනුව ආංශික ක්ෂේත්‍ර 10ක් ආවරණය වන පරිදි අමාත්‍යාංශ 10 ක් සමග මෙම කාර්ය සිදු කරයි. එම අමාත්‍යාංශ පහත සඳහන් කර ඇත.

01. ආරක්ෂක අමාත්‍යාංශය
02. මුදල් අමාත්‍යාංශය
03. අධිකරණ අමාත්‍යාංශය
04. අධ්‍යාපන අමාත්‍යාංශය
05. සෞඛ්‍ය අමාත්‍යාංශය
06. කම්කරු අමාත්‍යාංශය
07. සංචාරක අමාත්‍යාංශය
08. ජනමාධ්‍ය අමාත්‍යාංශය
09. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
10. කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

මෙම අදාළ අමාත්‍යාංශ සමග සාකච්ඡා කිරීම ආරම්භ කර ඇත. 2020 වසරේ දී අධිකරණ, කම්කරු,ජනමාධ්‍ය සහ ආරක්ෂක අමාත්‍යාංශ සමග රැස්වීම් 04 ක් පවත්වා ඇත. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී උපයෝගී කර ගැනීම පිණිස ප්‍රතිපත්තියේ අභිමතාර්ථයන් පැහැදිලි වනසේ සකස් කරන ලද ආකෘතියක් සෑම අමාත්‍යාංශයක් වෙත බෙදා හරින ලදී. එසේම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිස අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණය, අධ්‍යාපන, ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය, සමාජ අභිවෘද්ධි, කම්කරු හා රැකියා නියුක්තිය, සංචාරක, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණය, ආපදා සහ ළමා කටයුතු යන ආංශික ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සිදු කළ අතර, ඒ ඒ ක්ෂේත්‍රයන් සඳහා අදාළ දළ ක්‍රමෝපායික සැලැස්ම හඳුනා ගැනීම සිදු කර ඇත.





## ළමා ආරක්ෂාවට අදාළ නීති, ක්‍රියාපටිපාටි හා මාර්ගෝපදේශ සකස් කිරීම

අධිකරණ අමාත්‍යවරයා හා පැවති සාකච්ඡාව අනුව පහත සඳහන් මාතෘකා05 පදනම් කරගනිමින් විද්වත් කමිටු 05 ක් පත්කර ළමා ආරක්ෂාවට අදාල නීති,ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සකස් කිරීමට කටයුතු කරන ලදී.

අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධවන ළමයින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව සාකච්ඡාවක් 2020.10.02 දින අධිකරණ අමාත්‍යවරයා විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නියෝජිත නිලධාරින් සමග එම අමාත්‍යංශයේ දී පවත්වන ලද අතර එමසාකච්ඡාවට අනුවළමයින්ට අදාලව පවත්නා නීතියේ සංශෝධනය විය යුතු ක්ෂේත්‍ර 5 ක් හදුනාගන්නා ලදී.
එනම්,

1. ළමයින්ට අදාල විවිධ නීතිවල ළමයා යන වචනය සඳහා දී ඇති නිර්වචනයේ වයස විවිධ වීම. විවිධ අණපනත්වල ළමයා යන නිර්වචනය විවිධ අරුත් ගැන්වෙන බැවින් ළමයා යන නිර්වචනයෙහි නීතිමය තත්වය පොදු එකඟතාවයකට පත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
2. ළමා අපයෝජන නඩු සඳහා ළමා හිතකාමී අධිකරණ ක්‍රමවේදය හඳුන්වා දීම.
3. ළමයින්ට අදාල පොලිස් විමර්ශන මාර්ගෝපදේශය හඳුන්වා දීම.
4. වීඩියෝ සාක්ෂි සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටියහඳුන්වා දීම.
5. විනිසුරුවරුන් සඳහා ළමා අපයෝජන සහ ළමා වරදකරුවන් සඳහා දණ්ඩන ප්‍රතිපත්තියක් හෝ දණ්ඩන මාර්ගෝපදේශයක් සකස් කිරීම.

උක්ත විෂය ක්ෂේත්‍ර 5ට අදාලව ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් අනුකමිටු 5ක් පත්කර ඇත.

- කමිටු සාමාජිකත්වය නීති අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, පෞද්ගලික නීති වෘත්තිකයන්, නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන් සහ විෂය ක්ෂේත්‍රයේ අනෙකුත් ප්‍රවීණයන්.
- නීතිපති දෙපාර්තමේන්තුවෙන්කමිටු5 සඳහා නාම යෝජනා ලබාගැනීම.
- කමිටුසම්බන්ධීකරණයහාපහසුකම් සැලසීමේ කටයුතු, ළමා ආරක්ෂාව විෂයේ කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන 5 ක් වෙත පැවරීම. (අදාල රාජ්‍ය නොවන සංවිධාන 5 හදුනා ගෙන ඇත)
- විෂයටඅදාලව නීති පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණසහායකයින් ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ අවසන් වසර සිසුන් 25 කගේ සහාය ලබා ගැනීම.
- අනුශාසිකා: ශ්‍රේෂ්ඨාධිකරණවිනිසුරු ශිරාණී තිලකවර්ධන මිය.
- ඉහතකමිටුමෙහෙයවීම: නියෝජ්‍ය සභාපති නිතීඥ සුජාතා අලහප්පෙරුම මිය.

කමිටු 5 පහත දැක්වේ

| අනු කමිටු | 1 -විවිධ අණ පනත් ළමයා යන නිර්වචනයෙහි නීතිමය තත්ත්වය පොදු එකඟතාවයකට පත් කිරීම | 2 - ළමා අපයෝජන නඩු සඳහා ළමා හිතකාමී අධිකරණ ක්‍රමවේදය හඳුන්වා දීම. | 3 - ළමයින්ට අදාල පොලිස් විමර්ශන මාර්ගෝපදේශය හඳුන්වා දීම. | 4 - වීඩියෝ සාක්ෂි සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටිය හඳුන්වා දීම. | 5 - විනිසුරුවරුන් සඳහා ළමා අපයෝජන සහ ළමා වරදකරුවන් සඳහා දණ්ඩන ප්‍රතිපත්තියක් හෝ මාර්ගෝපදේශයක් සකස් කිරීම. |
|---|---|---|---|---|---|
| **කමිටු සාමාජික** | 1. මහාචාර්ය රෝස් | 1. ජනාධිපති නීතිඥ ප්‍රශාන්ත | 1. මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න | 1. ආචාර්ය ප්‍රතිභා මහානාම | 1. මහාචාර්ය ජීවා නිරිඇල්ල |

| | | | | | |
|---|---|---|---|---|---|
| **යින්** | විජේසේකර<br>2. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු<br>3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ<br>4. ජ්‍යෙෂ්ඨකථිකාචාර්ය රාජා ගුණරත්න<br>5. නීතිඥ සුපුන් ජයවර්ධන<br>6. නීතිඥ නිහාල් තල්දූව<br>7. නීතිපති නියෝජිත2යි | ලාල් ද අල්විස්<br>2. ජනාධිපති නීතිඥ උපාලි ගුණරත්න<br>3. ජ්‍යෙෂ්ඨකථිකාචාර්ය අමරදාස<br>4. නීතිඥ රන්ජන් ද සිල්වා<br>5. නීතිඥ හර්ෂණ නානායක්කාර<br>6. නීතිඥ සජීවනී අබේකෝන්<br>7. නීතිපති නියෝජිත 2යි | 2. ජනාධිපති නීතිඥ කපිල වෛද්‍යරත්න<br>3. නීතිඥ චන්ද්‍රා ප්‍රනාන්දු (පොලිස්පති)<br>4. නීතිඥ ගාමිනී දිසානායක (නි.පො.ප)<br>5. නීතිඥ අජිත් රෝහණ (නි.පො.ප)<br>6. නීතිපති නියෝජිත 2යි | 2. ජනාධිපති නීතිඥ යූ . ආර් .ද සිල්වා<br>3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදයාංගනී<br>4. නීතිඥ මහේෂ් කටුලන්ද<br>5. නීතිඥ යූ .එම් . සපුකොටන<br>6. නීතිඥ සන්ධ්‍යා තල්දූව<br>7. නීතිපති නියෝජිත 2යි | 2. ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යදර්ශනී මිය<br>4. නීතිඥ ජේ.එම් . විජේබණ්ඩාර<br>5. නීතිඥ රෝෂිණී හෙට්ටිගේ<br>6. නීතිඥ ටෙනී ප්‍රනාන්දු<br>7. නීතිපති නියෝජිත 2යි |
| **සම්බන්ධී කරණ කටයුතු** | යුනිසෙෆ් (Unicef) | සේව් ද චිල්ඩරන්(Save the children) | ආසියා පදනම (Asia Foundation)හා UNODC | ලීඩ්ස් සහ වර්ල්ඩ් විෂන් (Leads and World Vision) | චයිල්ඩ් ෆන්ඩ්(Child Fund) |

**මෙම අනු කමිටු මගින්,**

1. ශක්‍යතා අධ්‍යයනය (Need Assessment) සිදු කිරීම.
2. සංකල්ප පත්‍රිකාව (concept paper)සකස් කිරීම.
3. අදහස් හා යෝජනා එකතුව සඳහා වැඩමුළු/ මණ්ඩප (Stake holder Workshops) සාකච්ඡා පැවැත්වීම.
4. පාර්ශවයන්ගේ එකඟතාවය (Stake holder agreement)

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සැකසීම

ජාතික ළමා දිවාසුරැකුම් ප්‍රතිපත්තියේ කෙටුම්පතක් සකස් කර අවසන් කර ඇත. මෙම කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කර ගන්නා ලදී. එම විශේෂඥ කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය නැවත සකස් කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

## ළමා ආරක්ෂණය තහවුරු කිරීම සඳහා අවම ප්‍රමිතීන් සකස් කිරීම සහ නියාමන කටයුතු

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් විකල්ප ළමා රැකවරණ සේවා සපයන ආයතන 11ක් හඳුනාගෙන ඇත. ඒවා සියල්ලටම අවම ප්‍රමිතීන් සකස් කර ඇත.

**අනාථ, අත්හල, අසරණ ළමයින් වෙනුවෙන්**

1. ළමා සංවර්ධන මධ්‍යස්ථාන(Child Development Centers) හෙවත් ළමා නිවාස
2. රජයේ භාර ගැනීමේ නිවාස (Government Receiving Homes)

**බාල අපරාධකරුවන් වෙනුවෙන්**

1. රජයේ රැඳවුම් නිවාස(Government Remand Homes)
2. රජයේ සහතික කළ පාසල්(Certified Schools)

3. බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල සහ අභ්‍යාස විද්‍යාල (Child offenders training schools and correction Centres)

**වින්දිත ළමයින්වෙනුවෙන්**

4. විකල්පරකවරණ ක්‍රමයක් ලෙස සුදුසු තැනැත්තන් (Fit persons) (ඥාතීන්ට හා පවුලේ විශ්වාසවන්තයෙකු)වෙත භාරදෙන ලද වින්දිත ළමයින්

**තාවකාලික විකල්ප රැකවරණ වෙනුවෙන්**

5. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන(Child Day Care Centres)

**අධ්‍යාපන මධ්‍යස්ථානවල ළමයින්ගේ ආරක්ෂාව නියාමනය**

6. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන(Early Childhood Development Centres)
7. පාසල් ළමා ආරක්ෂක කමිටු(School Child Protection Committees/SCPC)
8. පාසල් ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපන පාසල් කමිටු(Compulsory Education school Committees)
9. ළමා නේවාසිකාගාර(Child Hostels.)

එම ආයතනවල නිලධාරීන්ට භාවිත කිරීම පහසු කිරීම සඳහා ODK App (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් මෙවලම් 11ක් සකස් කරන ලදී.මෙමගින් ආයතන භාරකරුවන්ට තම ආයතනවල තත්ත්වය තමන්ටම තක්සේරු කර ගැනීමටත් තම ආයතන තමන්ටම දියුණු කර ගැනීමටත් මෙමගින් අවස්ථාව ලැබේ. එසේම ළමා රැකවරණ සේවා සපයන ආයතන නියාමනය කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකියාව ලැබේ.

මාර්ගගත අවම ප්‍රමිතීන් 11ක් පහත සඳහන් වේ.

1. **ළමා සංවර්ධන මධ්‍යස්ථාන(Child Development Centers)** සඳහා අවම ප්‍රමිතීන් හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලමසාදන ලදී.

2. **රජයේ භාර ගැනීමේ නිවාස (Government Receiving Homes)** සඳහා අවම ප්‍රමිතීන් හාODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලමසාදන ලදී.

3. **රජයේ රැඳවුම් නිවාස(Government Remand Homes)** සඳහා අවම ප්‍රමිතීන් හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

4. **රජයේ සහතික කළ පාසල්(Certified Schools)** සඳහා අවම ප්‍රමිතීන් හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

5. **බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල සහ අභ්‍යාස විද්‍යාල (Child offenders training schools and correction Centres)** සඳහා අවම ප්‍රමිතීන් හාODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලමසාදන ලදී.

6. **විකල්ප රැකවරණ ක්‍රමයක් ලෙස සුදුසු තැනැත්තන් (Fit persons) (ඥාතීන්ට හා පවුලේ විශ්වාසවන්තයෙකු)**වෙත භාරදෙන ලද වින්දිත ළමයින් සඳහා අවම ප්‍රමිතීන් හාODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලමසාදන ලදී.

7. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන(**Child Day Care Centres**) සඳහා අවම ප්‍රමිතීන් හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

8. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන(**Early Childhood Development Centres**)සඳහා අවම ප්‍රමිතීන් ගොඩනැංවීම හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

9. පාසල් ළමා ආරක්ෂක කමිටු(**School Child Protection Committees/SCPC**) සඳහා අවම ප්‍රමිතීන් හාODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලමසාදන ලදී.

10. පාසල් ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපන පාසල් කමිටු (**Compulsory Education schoolCommittees**)සඳහා අවම ප්‍රමිතීන් හා ODK (Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

11. ළමානේවාසිකාගාර (**Child Hostels**) සඳහා අවම ප්‍රමිතීන් ගොඩනැංවීම හා ODK(Open Data Kit) ඩිජිටල් තාක්ෂණය භාවිතා කරමින් අවම ප්‍රමිතීන් සඳහා මෙවලම සාදන ලදී.

## ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතනවල පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කරනුලබයි. එය විද්‍යුත් තාක්ෂණය භාවිතා කරමින් වඩා කාර්යක්ෂමව මෙම වසරේ සිට ODK ක්‍රමය මගින් සිදු කරන ලදී. මෙම නියාමනය අවසානයේ සෑම නිවාසයක්ම ලබාගන්නා ලකුණු පදනම් කර ගනිමින් කාණ්ඩගත කිරීමේ ක්‍රමයක් භාවිතා කරනු ලබයි. එම කාණ්ඩගත කිරීමේක්‍රමයඉහළට යාම දියුණු කළ යුතු අවම ප්‍රමිතීන් සම්බන්ධයෙන් අවබෝධය ලබා දීම සිදුකරයි. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් යම්කිසි පියවරක් ගතයුතු නම් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාදීමට ද මෙම නියාමනයේ ප්‍රතිඵල භාවිතා කරනු ලබයි. ළමා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධ ඉහත  අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. 2020 වසරේ දී ODK මෘදුකාංගය යොදා ගනිමින් මාර්ගස්ථ තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 315 කනියාමනය අවසන්කර ඇත.මේ සම්බන්ධයෙන් සකස් කරන ලද අවසන් වාර්තාව රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජාතික කොමසාරිස් සහ සියළුම පළාත් කොමසාරිස්වරුන් වෙත යොමු කර ඇත.





## “ළමා සංවර්ධන මධ්‍යස්ථාන (ළමා නිවාස) නියාමනය පිළිබඳ ජාතික වැඩසටහන” සකස් කිරීමේ දී පහත ක්‍රමවේදය භාවිතා කරන ලදී

ළමාකටයුතුපිළිබඳසියළුමපාර්ශවයින්ගේඒකඟතාවයෙන් ජාතිකළමාආරක්ෂකඅධිකාරියේමූලිකත්වයෙන්කෙටුම්පත් කර ඇති ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ ආයතන සඳහා වන මාර්ගෝපදේශයේ සඳහන් නිර්දේශ භාවිතයෙන් අවම ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම සිදු කර ඇත.

එමකෙටුම්පත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේනිර්දේශ හා සංශෝධන ඇතුළත්ව පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන්ගෙන් අදහස් හා යෝජනා ලබා ගැනීම එම යෝජනා අනුව සංශෝධනය කරමින් අවම ප්‍රමිතීන් ලේඛණය සකස් කිරීම. එම ප්‍රමිතීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පරිවාස හා ළමාරක්ෂක සේවා ජාතික කොමසාරිස් හා පළාත් පරිවාස හා ළමාරක්ෂකසේවා කොමසාරිස්වරුන් දැනුවත් කිරීම සිදු කර ඇත.

## ළමා සංවර්ධන මධ්‍යස්ථාන ශ්‍රේණිගත කිරීම හා ඇගයීම

ඒ අනුව 2020 සැප්තැම්බර් මාසය තුළ ශ්‍රී ලංකාවේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 315 ක් නියාමනය කරන ලදී. එම නියාමනයේ ප්‍රතිඵල මත ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලබා ගන්නා ලකුණු ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මධ්‍යස්ථාන වර්ගීකරණය කරනු ලබයි. ඒ පහත ආකාරයෙනි.

**ශ්‍රේණිගත කිරීම හා ඇගයීම**

| ලකුණු පරාසය | තක්සේරුව | අදාළකාණ්ඩය |
|---|---|---|
| **1 – 4** | ළමා සුරක්ෂිතතාවයට දැඩි තර්ජනයක් බැවින් කඩිනමින් මැදිහත්වියයුතුය | ★ |
| **4 –7** | ළමා සුරක්ෂිතතාවයට දැඩිතර්ජනයක් නොමැති වුවත් දියුණු කළ යුතු තත්ත්වයක පවතී | ★ ★ |
| **7 - 10** | ළමා සුරක්ෂිතතාවය පිළිබඳ සෑහීමට පත්විය හැක. අදාළ කාලයේදී අධීක්ෂණය කළ හැක | ★ ★ ★ |

**2020 වර්ෂයේ සිදු කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනයේ ප්‍රතිඵල පහතින් දක්වා ඇත.**


2020 නියාමනය කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව= 315

2020 ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබන මුළු ළමුන් සංඛ්‍යාව = 8775


### (1) ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ වසර 03ට වඩා සිටින ළමුන් සඛ්‍යාව

2020 ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ වසර 03කට වඩා සිටින මුළු ළමුන් සංඛ්‍යාව (n) = 4999 (57%)


| ළමුන් වර්ග | සංඛ්‍යාව 8775 | ප්‍රතිශතය |
|---|---|---|
| වසර 3කට වඩා සිටින අසරණළමයි සංඛ්‍යාව | 2748 | 31% |
| වසර 3කට වඩා සිටින අත්හලළමයි සංඛ්‍යාව | 1184 | 13% |
| වසර 3කට වඩා සිටින අනාථ ළමයි සංඛ්‍යාව | 771 | 09% |
| වසර 3කට වඩා සිටින අපයෝජනවින්දිත ළමයි | 288 | 03% |
| වසර 3කට වඩා සිටින ළමාවරදකරුවන් සංඛ්‍යාව | 08 | 01% |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ වසර 3කට වඩා සිටින මුළු ළමුන් සංඛ්‍යාව | 4999 | 57% |




### දිස්ත්‍රික්ක අනුව දිවයිනේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ව්‍යාප්තිය - 2020



## පළාත් අනුව දිවයිනේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ව්‍යාප්තිය - 2020




2020 ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය අවසන් කරන ලදි.සම්පූර්ණ ස්වේච්ඡා ළමාසංවර්ධන මධ්‍යස්ථාන ගණන 315 කි. 2020 වර්ෂයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ දිවයිනේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ කාණ්ඩගත වී ඇති ආකාරය


| අංකය | වර්ණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රතු | 02 |
| 02 | කහ | 50 |
| 03 | කොළ | 263 |

රතු ලබාගත් මධ්‍යස්ථාන 02 දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරියාගේ මූලිකත්වයෙන් වූ කණ්ඩායමක් මගින් සති 2ක් ඇතුළත නියාමනය කරනු ලැබේ.

කහ ලබා ගත් මධ්‍යස්ථාන එම ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියා මගින් මාස 2 ක් ඇතුළත නැවත නියාමනය කරනු ලැබේ.


## දිස්ත්‍රික්ක අනුව දිවයිනේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සංඛ්‍යාව - 2020 වර්ෂය


රතු - 02, කහ - 50, කොළ -263




## 2020 වර්ෂයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ දිවයිනේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රධාන කාණ්ඩ 03 යටතේ කාණ්ඩගත වී ඇති ආකාරය


රතු - 02, කහ - 50, කොළ - 263




### 2020 ළමා නිවාස (315) නියාමනයේ GPS ආකෘතිය මගින් ළමා නිවාස ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වී ඇති ආකාරය මනාව පැහැදිලි වේ



මෙම නියාමනයේ එක් එක් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල තත්ත්වය පිළිබඳ වාර්තා අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට හා අදාළ පළාත් කොමසාරිස්වරුන් වෙත දන්වා ඇත.

## පාසල් ළමා ආරක්ෂක කමිටු නියාමනය කිරීම

2011/17 අධ්‍යාපන චක්‍රලේඛයට අනුව 6 ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණි සඳහා 2012 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන හෙවත් “සුරකුම් පව්ව” වැඩසටහන නියාමනය කිරීම සඳහා අවම ප්‍රමිතීන් සකස්කර ඇත.

පාසල් ළමා ආරක්ෂක කමිටු අවම ප්‍රමිතීන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර ඇත.

අවම ප්‍රමිතීන් පිළිබඳව සකස්කරන ලද මාර්ගගත පෝරමය සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන ඌව පළාතෙන් ආරම්භ කරන ලදී.

ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් හා බදුල්ල පළාත් ප්‍රධාන ලේකම් ශ්‍රවණාගාරයේ දී අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී.

ළමා ආරක්ෂක කමිටු නියාමනයට අදාළ මාර්ගගත නියාමන ප්‍රශ්නාවලිය සියළු සංශෝධන අවසන් කොට සිංහල හා දෙමළ බසින් සකස්කොට අවසන් කර ඇත.





## රජයේ භාරගැනීමේ නිවාස (Government Receiving Homes) නියාමනය කිරීම

රජයේ භාර ගැනීමේ නිවාස නියාමනය කිරීම තුළින් ආයතනය පවතින තත්ත්වයන් තක්සේරු කිරීමටත්, එම තක්සේරුව නිවාස භාරකරුවන් වෙත දැන්වීම මගින් එහි රැකවරණය ලබන සෑම බිළිදෙකුගේම ආරක්ෂාව, රැකවරණය සහ සංවර්ධනය දියුණු කිරීම සඳහා උපයෝගී කර ගැනීමයි. අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සැලසුම් සකස් කර අවසන්කර ඇත.

අවමප්‍රමිතීන් අනුවරජයේ භාර ගැනීමේ නිවාස නියාමනය කිරීමට අදාළ ODK මාර්ගගත පෝරමය සකස් කරන ලදී. මෙම පෝරමය ODK ජංගම දුරකථන යෙදවුම ඔස්සේ භාවිතා කර හැකිය.

## රජයේ රැඳවුම් නිවාස (GovernmentRemand Homes) නියාමනය කිරීම.

රජයේ රැඳවුම් නිවාස නියාමනය කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සැලසුම් කර ඇත. ඒ අනුව විෂය කරුණු කිහිපයක් යටතේ අදාළ රැඳවුම් නිවාස තුළ ළමුන් සියළු අපචාර සහ අපයෝජනවලින් ආරක්ෂා කිරීම, සෞඛ්‍ය පහසුකම් සැලසීම, පවතින අවම ප්‍රමිතීන් යනාදිය සම්බන්ධයෙන් තක්සේරු කිරීමත්, අවදානම් තත්ත්වයන් පවතී නම් කඩිනමින් පියවර ගැනීම සඳහා අදාළ පාර්ශව දැනුවත් කිරීමට මෙම නියාමනය උපයෝගී කර ගනියි.

අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය.

## රජයේ සහතික කළ පාසල් (Certified Schools) නියාමනය කිරීම

රජයේ සහතික කළ පාසල් නියාමනය කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සැලසුම් කර ඇත.

ඊට අදාළව අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. සහතික කළ පාසල්වල පවතින තත්ත්වයන් තක්සේරු කිරීමටත්, එම තක්සේරුව අදාළ පාසල් භාරකරුවන් වෙත දැන්වීම මගින් එහි රැකවරණය ලබන සෑම ළමයකුගේ ම ආරක්ෂාව, රැකවරණය සහ සංවර්ධනය දියුණු කිරීම සඳහා එය ඉවහල් කර ගැනීමටත්, ළමා අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට මෙමගින් හැකිවේ. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය.

## බාල අපරාධ කරුවන්ගේ පුහුණු පාසල (Child offenders training schools) සහ අභ්‍යාස විද්‍යාල (Correction Centers) නියාමනය කිරීම

බාල අපරාධකරුවන්ගේ පුහුණු පාසල (Youthful offenders training schools) සහ අභ්‍යාස විද්‍යාල නියාමනය කිරීමට ODK මගින් සියලු කටයුතු සකසා අවසන් කර ඇත.

## විකල්ප රැකවරණ ක්‍රමයක් ලෙස සුදුසු තැනැත්තන් (Fit persons) (ඥාතීන්ට හා පවුලේ විශ්වාසවන්තයෙකු) වෙත භාරදෙන ලද වින්දිත ළමයින් පිළිබඳව නියාමනය කිරීම

විකල්ප රැකවරණ ක්‍රමයක් ලෙස ඥාතීන්ට හා පවුලේ විශ්වාසවන්තයෙකු වෙත භාර දෙන (Fit Person) වින්දිත ළමුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් විධිමත් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සැලසුම් කර ඇත. දෙමාපිය භාරකරුවෙකුට එරෙහිව ළමා අපයෝජන චෝදනා එල්ලවන අවස්ථාවක එම අපයෝජනයට ගොදුරුවූ ළමයා තවදුරටත් එම දෙමාපිය භාරකරු වෙත රැඳවීම වෙනුවට ළමයා විකල්ප රැකවරණයක රැඳවීම සිදු කෙරේ. ළමයාගේ සමීප ඥාතියෙකු හෝ පවුලේ විශ්වාසවන්තයෙකු ළමයාට විකල්ප රැකවරණයක් සැපයීමට සුදුසු අයෙකු සේ සලකා අධිකරණය මගින් මෙලෙස ළමයින් ඔවුන් වෙත භාර දීම් සිදු කෙරේ. මෙලෙස ළමයින්ගේ රැකවරණය තාවකාලිකව සපයන තැනැත්තන්ගෙන් එම ළමයින්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම් සිදු නොවීමෙන් සහ අධ්‍යාපනය සම්බන්ධ ගැටළු හේතුවෙන් එම ළමයින් දුෂ්කරතාවයන්ට පත්වන අවස්ථා පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වේ.

මෙම හේතු මූලික කොටගෙන අදාළ ළමයින් සමාජගත වීමේදී විවිධ ගැටළු ගොඩනැගී තිබේ. එබැවින් අදාළ ළමුන්ගේ සුරක්ෂිත බව ගොඩනැගීම වෙනුවෙන් මෙම ළමයින් සම්බන්ධයෙන් විධිමත් නියාමන ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ක්‍රියා කරයි. 2020 වසරේ නියාමනය සිදු කිරීමට අදාළ මාර්ගගත ප්‍රශ්නවලිය ODK මෘදුකාංගය භාවිතා කරමින් සම්පූර්ණ කර තිබේ.මේ සම්බන්ධයෙන් ජාතික පරිවාස කොමසාරිස් සහ පළාත් පරිවාස කොමසාරිස්වරුන් සමග සම්බන්ධීකරණ කටයුතු අවසන් කර ඇත. මෙහි අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර තිබේ.

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන (Child Day Care Centers) නියාමනය

ශ්‍රී ලංකාවේ ළමා රැකවරණ සේවා සපයන ආයතන අතර ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනියි. එබැවින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම ආරම්භ කිරීමට අපේක්ෂිතය. මෙම නියාමනය අවසානයේ දී සෑම මධ්‍යස්ථානයක්ම ලබාගන්නා ලකුණු පදනම් කර ගනිමින් කාණ්ඩගත කිරීමේ ක්‍රමයක් භාවිතා කරනු ලබයි. එම කාණ්ඩගත කිරීම ඉහළට යාම සඳහා ගත යුතු අවම සුදුසුකම් සම්බන්ධයෙන් අවබෝධය ලබාදීම සිදුකරයි. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් යම්කිසි පියවරක් ගතයුතු නම් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාදීමටද මෙම නියාමනයේ ප්‍රතිඵල භාවිතා කරනු ලබයි. මෙහි අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය. මෙම කාර්යය සිදු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සියළුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර තිබේ. එමෙන්මසියළුම පළාත්වල පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කර ඇත.

## මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (Early Childhood Development Centres) නියාමනය පිළිබඳ ජාතික වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මුල් ළමාවියසංවර්ධන මධ්‍යස්ථාන නියාමන ක්‍රියාවලිය අදියර දෙකක් ඔස්සේ සිදු කිරීමට සැලසුම් කර ඇත. අදියර අංක 01 යටතේ අදාළ කාර්යය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි විසින් නියාමනය සිදු කිරීමත්, අදියර අංක 02 යටතේ නම් කළ නිලධාරී කණ්ඩායමක් විසින් නියාමනය සිදු කරයි. මේ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු අවසන් කර තිබේ.මාර්ගගත ප්‍රශ්නවලිය සම්පූර්ණ කර තිබේ.අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්වල මුල් ළමාවිය සංවර්ධනය විෂය භාර (පෙර පාසල්) අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය. මේ සම්බන්ධයෙන් ළමා ලේකම් කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කර ඇති අතර, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර තිබේ.

## පාසල් ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපන කමිටු (Compulsory Education Committees) නියාමනය කිරීම.

ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපනයට ඇති අයිතීන් සුරක්ෂිත කිරීමේ අරමුණින් පාසල් තුළ පිහිටුවා ඇති "පාසල් කමිටු" නියාමනය කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සැලසුම් කර ඇත. එහි දී පාසල් කමිටු නියාමනය කිරීමට සහ එම කමිටු අවම ප්‍රමිතීන් අනුව සකස් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සහය ලබාදීම සිදු කරයි. 2020 වසරේදී මෙම නියාමනය සිදු කිරීම

ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර තිබේ. මෙම නියාමන කාර්යයන් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් සිදු කිරීම පිණිස අවශ්‍ය මාර්ගගත ප්‍රශ්නාවලිය සකස් කර අවසන් කර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන් සහ දිස්ත්‍රික් අධ්‍යාපන නිලධාරීන් සමග මෙය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු අවසන් කර ඇත.

### ළමා නේවාසිකාගාර (Child Hostels) නියාමනය කිරීම.

මේ සම්බන්ධයෙන් අවම ප්‍රමිතීන් සකස්කර අවසන් කර ඇත. ඒ අනුව නියාමන කටයුතු සිදු කිරීමේදී ඒවා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

## Covid 19 තත්ත්වය සම්බන්ධව"හදිසි ළමා ආරක්ෂක අවශ්‍යතා පිළිබඳ ජාතික සමීක්ෂණය" (Rapid Need Assessment during Covid 19)

**මෙම වැඩසටහන අදියර කිහිපයක් යටතේ සිදු කරන ලදී.**

මෙම කාර්යයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලදී.

1. 2020 අප්‍රේල් 29 - COVID 19 කාලය තුළ හදිසි ළමා ආරක්ෂක අවශ්‍යතා- ප්‍රශ්නාවලිය සකස් කිරීම

2. 2020 මැයි 23 - COVID 19 කාලය තුළ හදිසි ළමා ආරක්ෂක අවශ්‍යතා- ප්‍රශ්නාවලිය මූලික පරීක්ෂාව සිදු කරන ලදි. (Pre-test)

3. 2020 ජූනි 01 සිට 2020ජූනි 10 - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූලිකත්වයෙන් UNICEF, Child Fund හා World Vision සමග ජාතික සමීක්ෂණය ජූනි මාසයේ පවත්වා අවසන් කළේය.

4. එය විශ්ලේෂණය කොට සැප්තැම්බර් මාසයේදී අවසාන වාර්තාව සකසන ලදී.

### අතහැර දැමූ බිළිඳුන් ආරක්ෂා කිරීම

ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.

ශ්‍රී ලංකාව තුළ විවිධ හේතුමත මෙන්ම විවිධ ස්ථානවල අතහැර යන අලුත උපන් බිළිඳුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තීරණය කරන ලදී . ඒ අනුව මෙම ළමුන්ගේ සුදුසු ඉදිරි රැකවරණය, භාරකාරත්වය සලසා දෙන තෙක් මෙම බිළිඳුන් භාර ගැනීම සඳහා පළාත් 09 හි ප්‍රධාන රෝහල්වල කවුළු ස්ථාපිත කිරීමට නියමිත වේ.

මෙම කවුළු සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ ප්‍රධාන රෝහල්වල ස්ථාපිත කිරීමට බලාපොරොත්තුවේ. මෙම කර්තව්‍යය ක්‍රමවත් ලෙස සහ සැලසුම්ගතව ක්‍රියාත්මක කිරීමට පූර්වයෙන් ඒ පිළිබඳ දත්ත ඒකරාශී කර විධිමත් අධ්‍යයනයක් සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. ආණ්ඩුවට උපදෙස් ලබාදී ඇත.

### පාසල් ළමා ආරක්ෂක කමිටු දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

2011/17 අධ්‍යාපන චක්‍රලේඛයට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන ලද ප්‍රධාන වැඩසටහනක් ලෙස පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා සක්‍රීය කිරීම හැඳින්විය හැකි ය. 2020 වසරේ දී  ශිෂ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් 203ක්, දෙමව්පිය දැනුවත් කිරිමේ වැඩසටහන් 81ක් සහ ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන් 131ක් සිදුකර ඇත.

### ළමා සංවර්ධන මධ්‍යස්ථාන (ළමා රැකවරණ සේවා සපයන නිලධාරීන් සහ ළමුන්) සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා සංවර්ධන මධ්‍යස්ථානවල රැකවරණය ලබන ළමුන්ගේ යහපැවැත්ම හා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ළමා රැකවරණ සේවා සපයන නිලධාරීන්ගේ, දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සිදු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එමෙන්ම මෙහි රැකවරණය ලබන ළමුන් සඳහා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් සංකල්ප පත්‍රිකා සකස්කොට අනුමැතිය ලබාගෙන ඇත.

### රජයේ රැඳවුම් නිවාස (ළමා රැකවරණ සේවා සපයන නිලධාරීන් සහ ළමුන්) සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

මෙම වැඩසටහන පවත්වනු ලබන්නේ රජය මගින් පවත්වාගෙන යන රැඳවුම් නිවාස සඳහාය. ඉහත ආයතන තුළ  රැකවරණය ලබන ළමුන්ට ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි. රැඳවුම් නිවාස තුළ ජීවත්වන ළමුන්ගේ යහපැවැත්ම හා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ළමා ආරක්ෂණ සේවකයින්ගේ, දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සිදු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ළමුන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා ඉහළ නැංවීමට ද මෙම වැඩසටහන් සැලසුම් කර තිබේ.අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදුකර ඇත.

### දිවා සුරැකුම් මධ්‍යස්ථාන (ළමා රැකවරණ සේවා සපයන නිලධාරීන් සහ ළමුන්) සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සේවයේ නියුතු කාර්යමණ්ඩලය සඳහා මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන තුළ රැකවරණය ලබන  ළමුන්ගේ යහපැවැත්ම හා සුරක්ෂිතතාවයසම්බන්ධයෙන් ළමා ආරක්ෂණ සේවකයින්ගේ, දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙමගින් සිදු කරයි. මෙම මධ්‍යස්ථාන තුළ ළමා හිතකාමී පරිසරයක් ඇති කිරීම මෙම වැඩසටහනේ අරමුණවේ. වැඩසටහන් සඳහා සම්බන්ධීකරණ කටයුතු අවසන් කර ඇත.

### රජයේ භාර ගැනීමේ නිවාස සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන (ළමාරැකවරණ සේවා සපයන නිලධාරීන් සහ ළමුන්)

රජය මගින් පවත්වාගෙන යන භාර ගැනීමේ නිවාස තුළ සේවය කරනු ලබන සේවකයන් දැනුවත් කිරීම සිදු කරයි. මෙම දැනුවත් කිරීම තුළින් භාර ගැනීමේ නිවාසවල ළමුන්ගේ යහපැවැත්ම හා

සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සිදු කරයි. අවම ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇත. ODK මෘදුකාංගය භාවිතා කරමින් ප්‍රශ්නාවලිය සකස් කර අවසන්ය.

## වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිත ළමුන් සහ ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන

වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිත ළමුන් සහ ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන් උදෙසා මනෝසමාජීය ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.මෙම වැඩසටහන දියත් කිරීමේ අරමුණු අතර, වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන් සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගනිමින් සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම වතු ආශ්‍රිතව ජීවත්වන විවිධ ගැටළුවලට මුහුණදුන් ළමුන් හඳුනා ගැනීමත්, ඊට බලපා ඇති සාධක හා පවුල් පසුබිම හඳුනා ගැනීමෙන් අවශ්‍ය උපදේශනය ලබාදීම හා පසුවිපරම් සිදු කිරීම, වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ මානසික ආතතිය අවම කිරීම උදෙසා නිර්මාණාත්මක සහ චිකිත්සක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වතු ආශ්‍රිතව ජීවත් වන ළමුන්හට සිය අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබාදීම, වතු ආශ්‍රිතව ජීවත් වන ළමුන්ට සවන්දීම, වතු ආශ්‍රිතව ජීවත් වන ළමුන්ගේ තීරණ ගැනීමේ හැකියාව හා අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීම, වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම මෙන්ම වතු ආශ්‍රිතව පූර්ණ පෞරුෂත්වයකින් හෙබි ළමා පරපුරක් ජාතියට උරුම කර දීම යනාදියවේ.

මේ අනුව 2020 වර්ෂය තුළදී මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මොණරතැන්න වත්ත, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මූවන්කන්ද වත්ත හා අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ජම්බුගස්මඩ වත්ත ආශ්‍රිත ළමුන් උදෙසා මනෝසමාජීය ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර ඇත. එමගින් ප්‍රතිලාභ ලැබූ ළමුන් සංඛ්‍යාව 104 කි. එමෙන්ම අඹගමුව, මල්ලවපිටිය, අතුරුලිය, පැල්මඩුල්ල, මාවතගම, අරණායක, තවලම, රත්තොට, පොල්ගහවෙල, උකුවෙල, ගඟවටකොරළේ, කහවත්ත, කොත්මලේ, මැදදුම්බර, ගඟඉහළ කෝරළේ, නිවිතිගල, බඩල්කුඹුර, ඇල්පිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් අදාළ  වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන් උදෙසා මනෝසමාජීය ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මනෝසමාජීය උපකරණ මිලදී ගැනීමද සිදු කර ඇත.

## පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

මෙම වැඩසටහනින් ශ්‍රී ලංකාවේ පවතින සෑම පොලිස් අභ්‍යාස විද්‍යාලයකම පුහුණුව ලබන සෑම පුහුණුලාභියෙකුම ළමුන්ට එරෙහිව සිදුවන විවිධාකාරයේ අපයෝජන වළක්වා ගැනීමත්, අපයෝජනයට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීමටත් සහ ඊට බලපාන හේතු නිවාරණය කිරීමටත් අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ගොඩනගා ගැනීමට මෙය උපයෝගී කර ගනියි. එහි ඌව පළාත් වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මොණරාගල හා බදුල්ල පොලිස් නිලධාරීන් සඳහා වූ වැඩසටහන  බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.

## ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා අධ්‍යාපන කාර්යමණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා අධ්‍යාපන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. යාපනය, මාතර, මහනුවර සහ නුවරඑළිය

යන දිස්ත්‍රික්වල විද්‍යාපීඨයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## සෞඛ්‍ය අංශයේ වෘත්තිකයන් සහ කාර්යමණ්ඩල දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය සේවා නිලධාරිනියන් මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයින් සහ පශ්චාත් උපාධිය හදාරනු ලබන වෛද්‍යවරුන් සඳහා ළමුන් සම්බන්ධයෙන් සංවේදී සෞඛ්‍ය වෘත්තිකයන් පිරිසක් බවට පත් කිරීම, ළමුන් සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රජාමට්ටමින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම, රාජ්‍ය නිලධාරියෙකු මෙන්ම ප්‍රජා සාමාජිකයකු ලෙස ළමා අපයෝජනයකදී හෝ එවැනි අවදානම් තත්ත්වයකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම හා කුසලතා ලබාදීම සඳහා මෙම වැඩසටහන් සිදු කරනුලබයි. සෞඛ්‍ය වෘත්තිකයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ පවත්වන සබඳතාවය ශක්තිමත් කිරීම මෙමගින් සිදු කරනුලබයි. එමගින් ළමයින්ගේ ආරක්ෂාවේදී සෞඛ්‍ය වෘත්තිකයන්ගේ සහය ලබාගැනීම අපේක්ෂා කරයි.

ඒ අනුව 2020 වර්ෂය තුළදී නාඋල, නනදන් හා ගිරාදුරුකෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ආශ්‍රිතව දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් බව ලැබූ ප්‍රමාණය 117 දෙනෙකි.

තවද, 2020 වර්ෂය තුළදී පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් 54 දෙනෙක් උදෙසා ද මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වා ඇත.පශ්චාත් උපාධි වෛද්‍ය සිසුන්ගේ ළමා ආරක්ෂක පුහුණුව 2020.12.18 වෙනි දින ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

## පාසල් ප්‍රාථමික අංශ විෂය නිර්දේශයට ළමා ආරක්ෂණ ක්‍රම ඇතුලත් කිරීම .

මෙමගින් පාසල් වයසේ පසුවන සෑම ළමයෙකුම සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ ඍජු පෞරුෂයක් සහිත ළමා පිරිසක් බිහි කිරීම සඳහා පාසල් විෂයමාලාවට ළමා ආරක්ෂාව පිළිබඳ කරුණු ඇතුළත් කිරීම සිදු කරයි. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයසමඟ සාකච්ඡාවක් ද පවත්වන ලදී. මෙම පුහුණුව සඳහා යොදා ගනුලබන මෙවලම් සඳහා අවශ්‍ය අනුමැතිය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය වෙත යොමු කර ඇත.

ප්‍රාථමික ශ්‍රේණියේ විෂයමාලාව සඳහා ළමා ආරක්ෂාවට අදාළ කරුණු ඇතුළත් කිරීමට අදාළව ගුරු උපදේශකවරුන් වෙත ලබාදීමට සකස්කළ අධ්‍යාපන ආධාරක වීඩියෝපටය ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා එම මණ්ඩලයේ අනුමැතිය හිමිවිය. ඒ අනුව ඊට අදාළ මෙවලම් පිළිබඳ පුහුණුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සිදු කිරීමට ඉදිරියේදී අපේක්ෂා කරයි.

## සුනාමි කැපකරු මාපිය රැකවරණ වැඩසටහන

2004 වර්ෂයේ දිවයිනට බලපෑ සුනාමි ව්‍යසනයෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව කාර්යයන් කිහිපයක් ඉටු කරනු ලබයි.

සුනාමි කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩල වැඩසටහන මෙම වැඩසටහන දිස්ත්‍රික් අනුව වාර්ෂිකව සිදු කරයි. ඒ අනුව ගාල්ල, මාතර, හම්බන්තොට, මඩකලපුව හා අම්පාර ඇගයීම් මණ්ඩල පවත්වා ඇත. කැපකරු මාපිය වැඩසටහන යටතේ වර්තමානයේ ළමුන් 49 ක් රැකවරණය ලබයි.

**අධ්‍යාපන ආධාර ලබාදීමේ වැඩසටහන**


2020 වර්ෂයේ සෑම මසකම මෙම වැඩසටහන යටතේ ළමුන් 31ක්ට අධ්‍යාපනික කටයුතු සඳහා ආධාර ලබා දේ. එහිදී සුනාමි කැපකරු රැකවරණ භාරකාර මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ පරිදි රු.5000 බැගින් ළමුන් 24 දෙනෙකුට හා රු. 3500 බැගින් ළමුන් 7 දෙනෙකුට මාසිකව අධ්‍යාපන ආධාර ලබාදී ඇත. එම ළමුන් පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

| | දිස්ත්‍රික්කය | අධ්‍යාපන ආධාර ලබන ළමුන් ප්‍රමාණය |
|---|---|---|
| 01 | ගාල්ල | 02 |
| 02 | හම්බන්තොට | 15 |
| 03 | මාතර | 03 |
| 04 | මඩකලපුව | 05 |
| 05 | අම්පාර | 05 |
| 06 | කළුතර | 01 |
| මුළු සංඛ්‍යාව | | 31 |

## වින්දිත, ආන්තික හා අවදානමට ලක්වූ ළමුන් සඳහා අධ්‍යාපනික සහ වෙනත් අදාළ සහය ලබාදීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමුවන පැමිණිලි පදනම් කර ගනිමින්, විමර්ශනය කිරීමේදී හඳුනාගනු ලබන අධ්‍යාපන පහසුකම් අවශ්‍ය වින්දිත, ආන්තික සහ අනාරක්ෂිත භාවයට පත්වූ ළමුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම මූලික කාර්යය වේ. මේ අනුව ළමුන් 2144 ක් සඳහා රු. 223,6500.00ක මුදල් ප්‍රමාණයක් අධ්‍යාපන ආධාර වශයෙන් ලබාදී ඇත.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා එච්.අයි.වී. සහ ලිංගාශ්‍රිත රෝග පිළිබඳ නව යොවුන් වියේ දරුවන් දැනුවත් කිරීමේ අත්පොත




ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා එච්.අයි.වී සහ ලිංගාශ්‍රිත රෝග පිළිබඳ නව යොවුන්වියේ දරුවන් දැනුවත් කිරීම සඳහා අත්පොත සම්පාදනය කරන ලදි. මෙහි ප්‍රතිපාදන සෞඛ්‍ය

අමාත්‍යාංශය විසින් දරණ ලද අතර තාක්ෂණික දායකත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් විසින් ලබා දෙන ලදී.

### අවධානම් ළමුන් පිළිබඳ සිතියම්ගතකරණය

අවධානම් ළමුන් පිළිබඳ සිතියම්ගතකරණයට අදාළව නියාමන ව්‍යාපෘතිය වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා සංකල්ප පත්‍රිකා සහ මාර්ගගත පෝරම නිර්මාණය කිරීම අවසන් කර ඇත.

### 1929 ළමා උපකාරක දුරකථන අංකය පිළිබඳ දැනුවත් කිරීමේ ස්ටිකරයක් නිර්මාණය කිරීම

1929 ළමා උපකාරක දුරකථන අංකය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් සිංහල හා දෙමළ බසින් ස්ටිකර් 35,000ක් මුද්‍රණය කරන ලදී. මෙම ස්ටිකර් ළමා සංවර්ධන මධ්‍යස්ථාන, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලප්‍රදර්ශනය කර ඇත.

### ළමා අපයෝජන සම්බන්ධව සිදුකරන ආයතනික සිද්ධි සමාලෝචන (Institutional Case Conference)

අපයෝජනයට ලක්වූ ළමා වින්දිතයින් රෝහල් වලින් පිටත් කිරීමට පෙර එම වින්දිත ළමයින් සුදුසු භාරකාරත්වයකට පත්කල යුතුයි. ඒ සඳහා සුදුසු භාරකාරත්වය තීරණය කරන්නේ රෝහලේ සිදුකරන ආයතනික සිද්ධි සමාලෝචන සාකච්ඡාකින් පසුවය.

එය සංවිධානය කරන්නේ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා, විශේෂඥ ළමා රෝග වෛද්‍යවරයා, විශේෂඥ මානසික රෝග වෛද්‍යවරයා හෝ විශේෂඥ කාන්තා රෝග වෛද්‍යවරයා විසින්ය. ඔවුන් මේ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරියා, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරියා සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියා ඊට සහභාගී කරවා ගැනීම සඳහා රෝහලෙන් කැඳවීමක් සිදුකළ යුතුය. මේ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සහභාගිවේ.

2020 වර්ෂයේදී ඒ සඳහා ළමා ආරක්ෂක නිලධාරීන්ගේ දුරකථන අංක හා ඊ-මේල් ලිපිනයන් සහිත පෝස්ටරයක් නිර්මාණය කොට සෑම රෝහලකම ඉහත විශේෂඥ වෛද්‍යවරුන්ට එක පිටපතක් හා අනෙක් පිටපත අදාළ වාට්ටුවේ බිත්ති පුවරුවේ ඇලවීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් 2020 වර්ෂයේදී කටයුතු කරන ලදී.

මෙම සියලු ළමා ආරක්ෂක නිලධාරීන්ට ඔවුන් සේවය කරන ස්ථානයටම විශේෂවූ දුරකථන අංකයක් UNICEF ආධාරවලින්ලබා දෙන ලදී.

### ළමා මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබාදීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙතින් මනෝසමාජීය සහය අපේක්ෂාවෙන් පැමිණෙන ළමුන් සඳහාත්, වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණෙන ළමුන් සඳහාත් අවශ්‍ය පහසුකම් ලබාදීම සිදු කරයි. එමෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ද විශේෂ ඉල්ලීම් සිදු කරනු ලබන ළමුන් සඳහා ද මනෝසමාජීය සහය ලබාදීම් සහ අධ්‍යාපන උපකරණ කට්ටල ලබාදීම් සිදු කරන ලදී.

ඒ අනුව 2020 වසරේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණි ළමුන් 91 දෙනෙකු සඳහා ද, ඍජුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය  වෙත පැමිණෙන හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉල්ලීම් සිදු කරන ළමුන් 94 දෙනෙකු සඳහා ද මනෝසමාජීය මැදිහත්කරණය ලබාදීම සිදු කර ඇත.

කොවිඩ් 19 තත්ත්වය තුළදී,

- හම්බන්තොට  දිස්ත්‍රික් ලේකම්  කාර්යාලය  විසින් යොමුකළ  මානසික ව්‍යාකූලතාවයට පත් දරුවෙකු වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුකිරීම සඳහා අවශ්‍ය මනෝසමාජීය මැදිහත්කරණයන් සිදු කිරීම.
- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් යොමුකළ  කොවිඩ් 19 හදිසි ව්‍යවසන අවස්ථාවට ගොදුරු වූ දරුවන් වෙනුවෙන් මනෝසමාජීය උපකරණ මිලදී ගැනීම.
- කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්  කාර්යාලය  විසින් යොමුකළ කොවිඩ් 19 ව්‍යවසන තත්ත්වයට ගොදුරු වූ දරුවන් සඳහා මනෝසමාජීය සහාය ලබාදීම.

## පාසල් උපදේශන ගුරුවරුන් සඳහා මනෝසමාජීය පුහුණුව

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරුන් සඳහා මනෝසමාජීය දැනුවත් කිරීම මෙමගින් සිදු කරයි. ළමා ආරක්ෂාවට අදාළව ළමයින් වෙත මනෝසමාජීය සහයෝගය ලබාදීම හා උපදේශනය ලබාදීම සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම මෙතුළින් සිදු කරයි.

## දිරිය වැඩසටහන (වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා වන මනෝසමාජීය සහාය ලබාදීම)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගත් වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජීය සහය ලබාදීම තුළින් එම ළමුන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම මෙම වැඩසටහනින් සිදු කරයි. ප්‍රාදේශීය මට්ටමින් ළමුන් 2290 ක් සඳහා අඛණ්ඩ මනෝසමාජීය සහයන් සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

## ''සිත් සවිය'' ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහය සේවාව

කොවිඩ්19 ව්‍යවසන කාලසීමාව තුළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන රැසක් වසා තිබියදී දැයේ දරුවන්ගේ උපරිම සුබසිද්ධිය උදෙසා නව ක්‍රමවේදයක් ලෙස දුරස්ථ මනෝසමාජීය සහය සේවාව මෙම වර්ෂයේදී ආරම්භ කරන ලදී. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතාගේ සංකල්පයකට අනුව ''සිත් සවිය''ජාතික ළමාකේන්ද්‍රිය මනෝසමාජීය සහය සේවාවහඳුන්වාදෙන ලදී.

මෙහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශය ප්‍රධාන මෙහෙයුම් ඒකකය ලෙසට ක්‍රියාත්මක වන අතර ඊට සමගාමීව සමස්ත දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන් සහ ප්‍රදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සේවා සැපයීමේ ජාලයක් ස්ථාපිත කර ඇත.

මෙම මානසික ප්‍රථමාධාර සහ මනෝසමාජීය සහාය සේවාවන් සැපයීම නිරීක්ෂණය (Look ), සවන්දීම (Listen ) සහ සම්බන්ධීකරණය ( Link ) යන මූලධර්ම මත පිහිටා ක්‍රියාත්මක කරයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් පැය 24 පුරා ක්‍රියාත්මක වන 1929 ළමා උපකාරක දුරකථන සේවය

වෙත යොමුවන පැමිණිලි හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉහත සඳහන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් වෙත ලැබෙන සෘජු ඉල්ලීම් සඳහා මෙම සහාය සේවාව සපයයි. එහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශය මෙම කටයුතු සම්බන්ධීකරණය, තාක්ෂණික උපදෙස් ලබා දීම, මෙහෙයවීම සහ නියාමනය සිදු කරයි.

කොවිඩ්19 වසංගතයේ අවධානම දැඩිව ව්‍යාප්තව පැවති වකවානුව තුළ උක්ත සේවාව යටතේ 1929 සේවාවටවාර්තාවූ පැමිණිලි අතරින් මනෝසමාජීය අංශයට යොමුවූ පැමණිලි 363ක් සඳහා මනෝසමාජීය සහායන් සපයා ඇත. ඒ යටතේ ඇදිරි නීති බලපත්‍ර ලබාදීම්, දරුවන් හා දෙමාපියන් වෙන්ව සිටි පවුල් (ඇදිරිනීතිය හේතුවෙන්) එකතු කිරීම, ආර්ථික අපහසුතා ඇති පවුල් රජය, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කර තිබූ සහන සේවාවන් සමඟ සම්බන්ධ කිරීම, මානසික ආතතිය ඇතුළු අනෙකුත් මානසික ගැටළු සඳහා උපදේශන සේවා ලබාදීම්, වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වූ සේවාලාභීන් අදාළ වෛද්‍ය අංශ වෙත යොමු කිරීම යනාදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ සහාය සේවාවන් ලබාදීම් සිදු කර ඇත.
ඊට අමතරව Zoom සහ Microsoft Teams පහසුකම් හරහා මානසික ප්‍රථමාධාර ලබාදීම, අන්තර්ජාල අපරාධ වැළැක්වීම සම්බන්ධ විශේෂ පුහුණු වැඩමුළු ගණනනාවක් ද මෙම සේවාව හරහා නිලධාරීන් වෙත ලබාදෙන ලදී.

ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහාය සේවාව යටතේ මේවනවිට දිවයින තුළ උපදේශනය, මනෝ චිකිත්සන සහ මනෝසමාජීය සහාය සේවාවන් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, රජයේ රෝහල් ආදියේ තොරතුරු ඇතුළත් තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ඇති අතර, එය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ පළ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට කඩිනමින් සූදානම් කර ඇත. සියලුම මාධ්‍ය ආයතන සහ මහජනතාව වෙත අදාළ තොරතුරු ලබා දීමට මේ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට හැකි විය.

එමෙන්ම ළමයින්ගේ උපරිම යහපැවැත්ම උදෙසා කටයුතු කරන සියලුම නිලධාරීන්, ආයතන සහ මනෝසමාජීය සහාය සේවාවන් සැපයීමට අදාළ වෘත්තියවේදීන් සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් මාසික ප්‍රගති සමාලෝචන සාකච්ඡාවන් පැවැත්වීමට මෙම ජාතික සේවාව යටතේ ඉදිරියේදී සැලසුම් කර ඇත. මනෝසමාජීය සහාය සඳහා“ජාතික දත්ත පද්ධතියක්” සකස් කිරීම සිදු කර ඇත.

### **“සාරපැස ”මනෝ සමාජයීය සිද්ධි අධ්‍යයන අත්පොත**




ළමා ආරක්ෂණයේ පෙර ගමන්කරුවන් උදෙසා පිදෙන සිද්ධි අධ්‍යයන සංග්‍රහය පහත සඳහන් මාතෘකා 09 ක් ඔස්සේ සිද්ධි අධ්‍යයන 70 ව කින් සමන්විත අත්පොතකි. මෙහි විද්‍යුත් පිටපත සකසා අවසන් කර ඇත.

මෙය ළමා ආරක්ෂාව සම්බන්ධව පුහුණු මෙවලමක් ලෙස භාවිතා කිරීමේ අරමුණෙන් සකසා ඇත.විවිධ තත්ත්වයන් හා ආයතනවලසිදුවූ ළමා අපයෝජනවලදී ළමා ආරක්ෂක හා මනෝසමාජීය නිලධාරීන් විසින් සිදුකරනු ලැබූ ප්‍රශස්ථ ව්‍යවහාරයන් සම්බන්ධ සිද්ධි අධ්‍යයන ඇතුළත් කර අත්පොත සකස්කර ඇත. මෙම අත්පොත පහත ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබයි.

- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත මනෝසමාජීය මැදිහත්කරණය.
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආශ්‍රිත මනෝසමාජීය මැදිහත්කරණය.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත මනෝසමාජීය මැදිහත්කරණය.
- ධනාත්මක ශික්ෂණය හා යහපත් දෙමාපිය දූදරු සම්බන්ධතා.
- හදිසි ආපදා තත්ත්වයන්හිදී මනෝසමාජීය මැදිහත්කරණය.
- වෙරළබඩ කලාපය ආශ්‍රිත මනෝසමාජීය මැදිහත්කරණය.
- වින්දිත, අනාරක්ෂිත, ආන්තික හා අවධානම් සහිත ළමුන් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය.
- යහපත් ගුරු සිසු සබඳතා.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය.

## වෙරළබඩ ප්‍රදේශයේ මනෝසමාජීය මැදිහත්වීම

වෙරළබඩ කලාපය ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහනකි. මෙම වැඩසටහන සඳහා සම්බන්ධීකරණ කටයුතු අවසන් කර ඇත. ඒ ඒ ප්‍රදේශවල ආරම්භ කළ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

## ධනාත්මක ශික්ෂණය පිළිබඳ පාසල් ගුරුවරුන් සඳහා පුහුණුව

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස්කර අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා ලබාදෙන දෙමාපියන් හා ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත (ශික්ෂා) සිංහල සහ දමිළ භාෂාවෙන් පිටපත්14,835 ක් මුද්‍රණය කරන ලදී. මෙම අත්පොත යොදා ගනිමින් ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, දඬුවම් ලබාදීම අවම කිරීමේ අරමුණෙන් ගුරුවරුන් පුහුණු කිරීම් සිදු කරයි.

## ළමා රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල ළමයින් සහ කාර්යමණ්ඩලය සඳහා මනෝසමාජීය පුහුණුව

රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල ළමයින් සහ කාර්යය මණ්ඩලය සඳහා මනෝසමාජීය පුහුණුව ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු අවසන් කර ඇත.

## ශ්‍රී ලංකාවේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන (ළමා නිවාස) ආයතන සඳහා මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිති සංග්‍රහය

ශ්‍රී ලංකාව තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ජීවත්වන ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීම අතිශයින්ම වැදගත් වේ. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ

ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිති සංග්‍රහයේ කෙටුම්පත සකස් කර අවසන් කර ඇත.

## ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත ප්‍රකාශන (පෝස්ටර්, අත් පත්‍රිකා, පොත් යනාදිය)

ළමා අපයෝජනය වළක්වා ගැනීම සඳහා විවිධ තේමාවන් උපයෝගී කර ගනිමින් අත්පත්‍රිකා,පෝස්ටර්, පොත් සහ සඟරා වැනි මුද්‍රිත ප්‍රකාශන සකස් කිරීම.

2020 වසර තුළද පෝස්ටර් සහ ෆයිල් කවර මුද්‍රණය අවසන් කර ඇත.

1. "හොඳ ස්පර්ශය සහ නරක ස්පර්ශය" පෝස්ටර් 15,500 මුද්‍රණය කරන ලදි. (රූපය 01)

2. "ආරක්ෂා වන්නේ කෙසේදැයි මම දනිමි" පෝස්ටර් 15,500 මුද්‍රණය කරන ලදි. (රූපය 02)

3. පාසල් ළමුන් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සහ 1929 ළමා දුරකථන සේවය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ ෆයිල් කවර 10,000 මුද්‍රණය කරන ලදි. (රූපය 03)

4. "ළමා අපයෝජනය හඳුනා ගැනීම, වළක්වා ගැනීම සහ කළමණාකරණය" පොත භාෂා තුනෙන්ම මුද්‍රණය කරන ලදී. සිංහල - 5000, දමිළ - 3000 සහ ඉංග්‍රීසි - 2000 යනුවෙනි. ( රූපය 04 )

5. "ළමා වෙළඳාම හඳුනාගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්" (රට හදන සෞභාගයේ දැක්ම අනුව දරුවන් කායික දණ්ඩනයට, මානසික පීඩනයට, ලිංගික සහ වෙනත් ආකාරයේ අපයෝජනයට, නීති විරෝධි වාණිජ කටයුතු සඳහා ළමයින් යොදා ගැනීමට (Child Trafficking) ළමා ශ්‍රමිකයන් ලෙස ළමයින් භාවිත කිරීමට සහ නොසලකා හැරීමට බඳුන්වීම මුළුමනින් ම තුරන් කිරීම) සඳහා වැඩපිළිවෙලක් ලෙස මෙය සකසා මුද්‍රණය අවසන් කරන ලදී. ( රූපය 05)

6. 2021 රාජකාරී දිනපොත මුද්‍රණය කිරීම. ( රූපය 06)






(රූපය 01)(රූපය02)





( 03 රූපය )




(රූපය 04)




(රූපය 05)




(06 රූපය)

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය www.childprotection.gov.lkවෙබ් අඩවි සංවර්ධනය කිරීම සිදුවේ. නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදුකර ඇත. නව තාක්ෂණය යොදා ගනිමින් වඩා ඵලදායී තොරතුරු මහජනතාවට ලබාදීම සඳහා නවවෙබ් අඩවියක් සකස් කිරීම.AFFNO පුද්ගලික ආයතනය විසින් සමාජ සත්කාරක කටයුත්තක් ලෙස සිදු කිරීම ආරම්භ කරන ලදී.




## ළමා හිංසනයට එරෙහි ජාතික දිනය

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 38 වගන්තිය ප්‍රකාරව ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍ය සුමේධා ජී ජයසේන මහත්මියගේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 08/1765/333/010 යටතේ සම්මත කිරීමෙන් අනතුරුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය බලාත්මක වූ දිනය වන ජනවාරි 04 වන දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස නම් කරන ලද අතර, එතැන් සිට සෑම වසරකම ළමා හිංසනයට එරෙහි ජාතික දිනය සැමරීමට කටයුතු කරන ලදී. මෙවරද මෙම දිනය සැමරීම සිදු කරන ලදී.

## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාතික දිනය

ළමා ශ්‍රමිකත්වයට එරෙහි දිනය සැමරීම වෙනුවෙන් ළමා ශ්‍රමිකත්වය සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ මහතාගේ විශේෂ පණිවිඩයක් සහිත ළමුන් සහ දෙමාපියන් දැනුවත් කිරීමේ කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කොට එය ප්‍රචාරය කිරීම සිදු කරන ලදී.

## ලෝක ළමා දිනය

ලෝක ළමා දින ජාතික උත්සවය "අපේ රට - අපේ දැතින්" යන තේමාව යටතේ "අපේගම" පරිශ්‍රයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් පැවැත්විය. එහිදී ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් ළමයින්, ගුරුවරුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශනයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වන ලදී.

ලෝක ළමා දින ජාතික උත්සවයට සමගාමීව "අපේගම" පරිශ්‍රයේදී පැවති ජංගම ප්‍රදර්ශනය





## ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය

ඔක්තෝබර් 11 දිනට යෙදුන ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් 25ක් සිදු කරන ලදී.

## ප්‍රදර්ශන සහ ජංගම සේවා පැවැත්වීම

ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් අධ්‍යාපනික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. එම ආයතන මගින් ලැබෙන ඉල්ලීම්වලට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි සෑම වසරකම පැවැත්වීමට කටයුතු කරයි. 2020.02.22 වන දින "පොදු ජන සරණී" ජංගම ප්‍රදර්ශනය ඇඹිලිපිටියේ දී පවත්වන ලදී. 2020.10.01 වන දින ලෝක ළමා දිනයට සමගාමීව ජංගම ප්‍රදර්ශනයක් බත්තරමුල්ල "අපේගම" පරිශ්‍රයේ දී පවත්වන ලදී.

## විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ තොරතුරු ජනමාධ්‍ය ආයතන හා සම්බන්ධීකරය වෙමින් ප්‍රජාව අතරට රැගෙන යාමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි. ඒ සඳහා විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යයේ සහය ලබා ගැනීමේ ළමා ආරක්ෂාවට අදාළ ප්‍රවෘත්ති නිවේදන ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම හා විෂය කරුණුවලට අදාළව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම සිදු කරන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් විසින් ප්‍රාදේශිය ගුවන්විදුලි සේවා මගින් **"ළමා ආරක්ෂාව පිළිබඳ"** වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ජනමාධ්‍ය තුළ වැඩසටහන් පවත්වා ඇත.


## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් විසින් සම්පත්දායකත්වය ලබාදුන් ජනමාධ්‍ය වැඩසටහන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ සඳහන් ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම යටතේ මාධ්‍ය මගින් ළමයින්, ප්‍රජාව,වෘත්තිකයන් දැනුවත් කරන ලදී. මෙම ක්‍රමවේදය භාවිතා කිරීම විශේෂයෙන්ම අනුගමනය කරන ලද්දේ රටේ පැවති කොරෝනා - 19 වසංගතය හේතුවෙනි. එම වැඩසටහන් පහත සඳහන් කර ඇත.


| | |
|---|---|
| 01 | 2020.03.05 – වන දින නෙළුම් පොකුණේ පැවති "පුංචි පරිකල්පකයන්"යන වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වෙමින් ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ දේශනයක් පවත්වන ලදී. |
| 02 | 2020.03.10 වන දින අයි රූපවාහිණී නාළිකාවේ. "Rise and shine" වැඩසටහනට සහභාගි වීම. |
| 03 | 2020.03.30 වන දින දෙරණ "ඇය"වැඩසටහනට සහභාගි වීම. |
| 04 | 2020.03 - දෙරණ big focus වැඩසටහනට සහභාගි වීම. |
| 05 | 2020.04.10. රූපවාහිණී නුගසෙවන වැඩසටහනට සහභාගි වීම. |
| 06 | 2020.05.02- ස්වර්ණවාහිණී ප්‍රවෘත්ති. |
| 07 | 2020.05.21- රූපවාහිණී කොවිඩ් 19 ළමා ඇසින් වැඩසටහනට සහභාගි වීම. |
| 08 | 2020.06.05 පදනම් ආයතනයේ පැවති ළමා ආරක්ෂාව සම්බන්ධ දේශනය සිදු කිරීම**.** |
| 09 | 2020.07.10 වන දින ළමයින් සම්බන්ධයෙන් සිදු වන සයිබර් අපාරධ සම්බන්ධයෙන් සන්නස්ගල සමඟ සාකච්ඡාව. |
| 10 | 2020.07.22- වන දින සයිබර් ආරක්ෂාව පිළිබඳ මාර්ගගත පාඨමාලාව දියත් කිරීම. |
| 11 | 2020.08.17 වන දින දෙරණ Big Focus වැඩසටහනට සහභාගි වීම. |
| 12 | 2020.09.04. වන දින නෙත් එෆ්. එම් "බැලුම්ගල" වැඩසටහනට සහභාගි වීම. |
| 13 | 2020.10.01- වන දින ටී.එන්.එල්. නාලිකාවේ ලෝක ළමා දිනය වෙනුවෙන් පැවැත්වූ වැඩසටහනට නියෝජ්‍ය සභාපතිතුමිය වන සුජාතා අලහප්පෙරුම මහත්මිය සහභාගි විය. |
| 14 | 14. 2020.10.25 - ගුවන් විදුලි සංස්ථාවේ ඉංග්‍රීසි සේවයේ Straight from the Heart වැඩසටහනට සහභාගි වීම. |













## දෛනික පුවත්පත් තුළ ළමා අපයෝජන වාර්තාකරණය නියාමනය කිරීම

දෛනික පුවත්පත් මගින් වාර්තාවෙන ළමා ආරක්ෂාවට අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණයන් තුළ අනන්‍යතාවය හෙළිවන ආකාරයට ළමයින් සම්බන්ධ වාර්තාකරණ සිද්ධි තිබේද යන්න නියාමනය සිදු කරයි. එසේම සදාචාරත්මක නොවන ප්‍රවෘත්ති වාර්තාකරණයන් පිළිබඳ කටයුතු සිදු කරයි.

## ප්‍රවෘත්ති නිවේදන

1. ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. ( 2020.01.06)
2. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීම.(2020.01.08)
3. අන්තර්ජාලය හරහා දැරියන් බියවද්දා, ලිංගිකව අපයෝජන සිදු කළ 07 ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් අත්අඩංගුවට ගැනීම. (2020.02.20)
4. සමාජජාල මාධ්‍යය හරහා හුවමාරුව වන වයස අවුරුදු 06 ක පමණ දැරියක් ලිංගික අපයෝජනයට ලක් කරනු ලබන වීඩියෝ පටය ගැන තොරතුරු දන්නේනම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දන්වන්න. ( 2020.02.28)
5. දෙමාපියන්ට එපා වන බිළිඳු දරුවන් භාරගන්න, සෑම පළාතකටම විශේෂ රෝහල් කාමරයක් දෙන්න. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය රජයෙන් ඉල්ලයි. . ( 2020.03.06)
6. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල,මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සහ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමයින් කොරෝනා වෛරසයෙන් බේරාගන්න. (2020.03.13 )
7. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විමර්ශන සඳහා බාධා කළහොත් දැඩි නීතිමය ක්‍රියාමාර්ග. ( 2020.06.10)
8. වයස අවුරුදු 12 ක පිරිමි දරුවකු අපයෝජනයට ලක්කළ තවත් ටියුෂන් ගුරුවරයෙකු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අත්අඩංගුවට. (2020.08.19)
9. ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් 2020 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සෞභාග්‍ය දැක්ම සමග නව වැඩපිළිවෙලක්. ( 2020.08.20)
10. බාලවයස්කාර පිරිමි දරුවෙක් අපයෝජනය කළ නර්තන ගුරුවරයෙක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අත්අඩංගුවට. (2020.08.24)
11. වයස අවුරුදු 15ක දැරියක් ගැබිණියක කර, පලා ගොස් සිටි සැකකරුවෙකු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අත්අඩංගුවට. ( 2020.08.26)
12. කොවිඩ් - 19 ව්‍යවසන කාල සීමාව තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් නව මනෝසාමාජීය සේවාවන් රැසක්. ( 2020.09.02)
13. 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන දැරියන් තිදෙනෙකු අපයෝජනයට ලක්කළ පාසලේ මුරකරු, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අත්අඩංගුවට.( 2020.09.03)
14. බාලවයස්කාර පිරිමි දරුවකු කෲරත්වයට පත් කළ විදුහල්පතිවරයෙකුට වසර 02 ක බරපතල වැඩ සහිත සිර දඩුවම් නියම කෙරේ. (2020.09.14)
15. බාලවයස්කාර පිරිමි දරුවකු බරපතල ලිංගික අපයෝජනයකට ලක්කළ අයෙකුට වසර 10 ක බරපතල වැඩ සහිත සිර දඩුවම් නියම කෙරේ. (2020.09.17)
16. කොවිඩ් - 19 කාලය තුළ වැඩසටහන් ප්‍රචාරය කිරීම සම්බන්ධවයි. (2020.11.06)
17. 1929 ශ්‍රී ලංකා ළමා ආරක්ෂක යෙදුම එළිදැක්වීම. ( 1929 Sri lanka Child Protection App ) (2020.11.20)

### ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය හරහා තොරතුරු ලබාදීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය මගින් සමාජ මාධ්‍ය භාවිතා කරමින් ළමා ආරක්ෂාවට අදාළ තොරතුරු ළමයින්ට, ප්‍රජාවට, විද්‍යාර්ථයින්ට, වෘත්තිකයන්ට සහ පර්යේෂකයන්ට ලබාදීම සිදු කරයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල ෆේස්බුක් (facebook) සහ යූටියුබ් (you tube) ගිණුම යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම උදෙසා වාර්තා වැඩසටහන් සහ කෙටි වීඩියෝ පට නිෂ්පාදනය කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු සහ මාධ්‍ය ඒකකය මගින් ප්‍රථම වරට මෙම කාර්යය සිදු කරන ලදී. මෙම නිෂ්පාදන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මානව සම්පත් හා තාක්ෂණය යොදාගෙන සිදු කරන ලදී.

| | |
|---|---|
| 01 | ළමා සහභාගිත්වය තුළින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමසඳහා “අමල්බිසොයි මමයි” වාර්තා වැඩසටහන |
| 02 | ළමා සහභාගිත්වය සහ නිපුණතා සංවර්ධනය තුළින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා “පොතයි මමයි” වාර්තා වැඩසටහන. |
| 03 | ළමා ශ්‍රමිකත්වය පිළිබඳ කෙටි වීඩියෝ පටය |
| 04 | ළමා ලිංගික අපයෝජනය සහ නීතිය පිළිබඳ කෙටි වීඩියෝ පටය |
| 05 | .“අපි දරුවන්ට දැනෙන්න ආදරය කරමු” මනෝසමාජීය මැදිහත්කරණය පිළිබඳ කෙටි වීඩියෝ පටය |
| 06 | පවුල් සංස්ථාවේ බිඳ වැටීම තුළින් ළමයින්ට සිදුවන මානසික බලපෑම සහ සමාජ වගකීම තහවුරු කිරීම සඳහා “පිනිමල්” ටෙලි නාට්‍ය සකස් කිරීම |
| 07 | 1929 ළමා උපකාරක දුරකථන සේවය ප්‍රචාරය කිරීම සඳහා “දරුවෙක් වෙනුවෙන් මිනිසෙක් සිටී” ගීතය සකස් කිරීම - අනුග්‍රහය World Vision ආයතනය. |
| 08 | “දරුවන්ට එරෙහි සයිබර් අපරාධ වළකමු” කෙටි වීඩියෝ පටය |











## ළමා ආරක්ෂාව පිළිබඳ මාර්ගගත ක්‍රීඩා යෙදුම නිර්මාණය කිරීම

2020අගෝස්තු මාසයේදී ළමා ආරක්ෂාව පිළිබඳ මාර්ගගත ක්‍රීඩායෙදුම නිර්මාණය කිරීමේ කටයුත්ත නියමු වැඩසටහනක් ලෙස ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම සමාජගත කිරීම සඳහා ආරම්භ කරන ලදී. Save the children, world vision, sarvodaya, leads යන ආයතන ඒකාබද්ධ මූල්‍ය ප්‍රදානයක් ලෙස සිදු කිරීමට කටයුතු සිදු කර ඇත. ඒ අනුව මූලික සාකච්ඡා සිදු කර ඇත.





## 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවාව

මෙම ඒකකය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. ගාස්තු අය කිරීමකින් තොරව පැය 24 පුරා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා 03න් ක්‍රියාත්මකයි.

මෙම සේවය වඩාත් ඵලදායී සහ කාර්යක්ෂමව කිරීම සඳහා **1929 ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ යෙදවුම (Sri Lanka Child Protcetion App)** 2020.11.20 වන දින නිල වශයෙන් හඳුන්වා දෙන ලදී. මෙමගින් ළමයින්ට සහ ප්‍රජාවට ශ්‍රව්‍ය දෘශ්‍ය සහ ලිඛිත මාධ්‍ය ඔස්සේ ළමා අපයෝජනයන්ට අදාළව සාක්ෂි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු කිරීමට හැකියාවක්ලැබේ. 2020 වසරේදී 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවයට පැමිණිලි8,165 ක් ලැබී ඇත.

## 1929ශ්‍රී ලංකා ළමා ආරක්ෂක යෙදවුම

1929 ජංගම දුරකථන යෙදවුම සැකසීමේ කාර්යය නව තාක්ෂණය භාවිතා කරමින් ප්‍රථම වරට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන ලදී. Save the children international, World Vision, Sarwodaya fuston and Leads යන ආයතනවල ප්‍රදානයක් ලෙස මෙන්ම නියමු වැඩසටහනක් ලෙස මෙය සිදු කරන ලදී.

එමගින් කෙටි පණිවුඩ, හඬ පට හා වීඩියෝ සමගින් පැමිණිලි සාක්ෂි සහිතව කාර්යක්ෂමව නව තාක්ෂණය භාවිතා කරමින් ළමා අපයෝජන පිළිබඳව පැමිණිලි කිරීමට හැකියාව ඇත.






### අධිකාරියට පැමිණිලි කළ හැකි අනෙකුත් ක්‍රම


1. අධිකාරියට පැමිණ පැමිණිලි කිරීම
2. ලිපි මගින්
3. ෆැක්ස් මගින් අංකය (Fax): **0112 77 87 67**
4. ඊ මේල් (Email): chairman.ncpa@gmail.com
5. අන්තර් ජාල ළමා අපයෝජන සඳහා වෙනම WhatsApp අංකයක් ඇත- **077 32 200 32**

### පැමිණිලි මෙහෙයුම් මාර්ගෝපදේශය සැකසීම

මෙම මාර්ගෝපදේශය 2020 වර්ෂයේදී ප්‍රථම වරට සැකසීම සිදු කරන ලදී. තවද අධිකාරියේ විමර්ශන කටයුතු හා පැමිණිලි මෙහෙයවීමේ කටයුතු පහසුකරලීමේ අරමුණෙන් මෙම මාර්ගෝපදේශය අධිකාරී පනතට අනුකූලව මෙන්ම 1979 අංක 15 දරණ අපරාධ නඩු විදාන සංග්‍රහ පනත, දණ්ඩ නීති සංග්‍රහය හා ළමයින්ට අදාළ අනෙකුත් නීති පනත්, අණපනත් සැලකිල්ලට ගෙන සම්පාදනය කර තිබේ.

ශ්‍රී ලංකාවේ අවුරුදු 18 ට අඩු ළමයින් සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වන සියලු පැමිණිලිවල දී 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත ප්‍රකාරව අධිකාරියේ නිලධාරීන් කෙසේ මැදිහත් විය යුතුද? කොපමණ කාලයකින් මැදිහත් විය යුතුද? කවරෙකු විසින් වගකීම් දැරිය යුතුද? බලසීමාවන් කෙසේ විය යුතුද? ආදිය පැමිණිලි මෙහෙයුම් මාර්ගොපදේශයේ අන්තර්ගතවේ.

මෙම සංග්‍රහය ළමා අපයෝජන විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ මූලධර්ම පරිච්ඡේදයකින් හා අධිකාරියේ ඒ ඒ අංශ කෙසේ මැදිහත් විය යුතුද යන්න දැක්වෙන පරිච්ඡේදයකින් හා පොදු උපදෙස් සහිත පරිච්ඡේදයකින් යුක්ත වේ .ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැමිණිලි මෙහෙයවීම හෝ විමර්ශනය සඳහා බලය පවරන අධීක්ෂණය, ක්‍රියාත්මක වන සියලු නිලධරයන් සඳහා මෙම මාර්ගෝපදේශය බලාත්මක වෙයි.



## විමර්ශන හා නියාමන කටයුතු

| | | |
|---|---|---|
| 01 | විමර්ශන අංශයට ලැබුනු මුළු පැමිණිලි ගණන | 745 |
| 02 | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගණන | 485 |
| 03 | වසා ඇති පැමිණිලි ගණන | 260 |
| 04 | සාක්ෂි තොරතුරු ලබාදීමේ නියෝග පැමිණිලි යොමු කිරීම | 24 |
| 05 | මෙම වසර තුළ පවත්වා ඇති සිද්ධි අධ්‍යනයන් ගණන | 28 |
| 06 | අධිකාරියට පැමිණ සිදු කරන ලද පැමිණිලි භාර ගැනීම් | 228 |

| | |
|---|---|
| ● | දිවයින පුරා වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක නවයක් පළාත් මට්ටමින් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම |
| ● | දිවයින පුරා ළමා අපයෝජනවලට අදාළව නීති ක්‍රියාත්මක කිරීමසඳහා සම්බන්ධ වන පොලිස් නිලධාරීන් පුහුණු කිරීම |
| ● | පළාත් නවය සඳහා ළමා මහේස්ත්‍රාත් අධිකරණ නවයක් පිහිටුවීමට රජයට යෝජනා කර ඇත. (බත්තරමුල්ල හා යාපනය ළමා මහේස්ත්‍රාත් අධිකරණ දෙක පමණක් දැනට ලංකාවේ ක්‍රියාත්මක වේ.) |
| ● | පළාත් 9 සඳහා ළමා මහාධිකරණ 9 පිහිටුවීමට රජයටයෝජනා කොට ඇත. (අනුරාධපුර ළමා මහාධිකරණය පමණක් දැනට ක්‍රියාත්මක වේ.) |
| ● | ළමා පියස නවයක් පළාත් මට්ටමින් ඇති කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. |
| ● | සිද්ධි සමාලෝචන වැඩසටහන් පවත්වා වින්දිත ළමුන් සුදුසු භාරකාරීත්වයන්ට පත් කිරීමට අවශ්‍ය සහය ලබා දීම. |
| ● | බිළිඳුන් භාර ගැනීමේ කවුලු 9 ක් ඇති කිරීමට රජයට යෝජනා කර ඇත. |

## නීති බලාත්මක කිරීමට අදාළ ප්‍රගතිය

| | | |
|---|---|---|
| 01 | මුළු පැමිණිලි ගණන | 8165 |
| 02 | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගණන | |
| 03 | මේ වන විට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 4120 |
| 04 | පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති පැමිණිලි අතුරින් චෝදනා ගොනු කළ පැමිණිලි සංඛ්‍යාව | 303 |
| 05 | මෙම පැමිණිලිවලට සම්බන්ධ ළමා වින්දිතයින් අතරින් සිය පවුල් ඒකකය සමග සිටින ළමා වින්දිතයින් සංඛ්‍යාව | 5667 |
| 06 | ළමා වින්දිතයින් අතරින් සිය පවුල් ඒකකයෙන් ඉවත් කර ඇති සංඛ්‍යාව | 528 |
| 07 | තම අධ්‍යාපන කටයුතුවල (විධිමත් හෝ අවිධිමත් ) පෙර පරිදි අඛණ්ඩව නිරතවන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස (පාසල් නොයන සංඛ්‍යාව 643 යි, එය ප්‍රතිශතයක් ලෙස 8% කි.) | 92 % |
| 08 | නිසි පුහුණුවලත් පුද්ගලයින් විසින් මනෝසමාජීය සහය ලබා දී ඇති ළමුන් සංඛ්‍යාව | 1105 |

## 1929 ළමා උපකාරක දුරකථන සේවාව හා සෘජු පැමිණිලි සඳහා මනෝසමාජීය සහාය සේවාව ලබා දීම, අධීක්ෂණය සහ නියාමන කටයුතු

1929 ළමා උපකාරක දුරකථන සේවාව මෙන්ම සෘජුව වාර්තා වන පැමිණිලි දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් වෙත යොමු කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම සහ ළමයින්ගේ උපරිම යහපත උදෙසා විවිධ ආයතන, සේවාවන් හා නිලධාරීන් වෙත යොමු කිරීම, අවශ්‍ය උපදෙස්, මඟ පෙන්වීම් ලබා දීම මේ යටතේ සිදු කෙරේ.

2020 මනෝසමාජීය අංශය වෙත ලැබුණු 1929 පැමිණිලිවලට අදාළ ප්‍රගතිය

| | | |
|---|---|---|
| ● | අංශය වෙත යොමුවූ මුළු පැමිණිලි ගණන | 1105 |
| ● | මූලික වාර්තා ලැබී ඇති පැමිණිලි ගණන | 542 |
| ● | මූලික වාර්තා ලැබී නැති පැමිණිලි ගණන | 563 |
| ● | මනෝසමාජීය මැදිහත්කරණයන් ලබා දී අවසන්වූ පැමිණිලි ගණන | 129 |
| ● | තවදුරටත් පසුවිපරම් සිදු කෙරෙන පැමිණිලි ගණන | 413 |
| ● | ළමයින් සඳහා උපදේශන සේවා ලබාදීම් | 50 |
| ● | දුරකථන මාර්ගයෙන් මනෝසමාජීය මැදිහත්කරණය ලබාදීම | 732 |

එමෙන්ම,

| | | |
|---|---|---|
| ● | විඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා දරුවන් සූදානම් කිරීම සහ පටිගත කිරීම් අධීක්ෂණය | 91 |
| ● | සිද්ධි සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීම | 21 |

## ″ළමා ආරක්ෂක නිලධාරියාගේ විමර්ශන වාර්තාව ″හඳුන්වාදීම (Child Abuse Investigation report)

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 හෝ වෙනත් ක්‍රම මගින් ලැබෙන පැමිණිලිවල තොරතුරු ප්‍රමාණවත් නොවූ විට එම තොරතුරු ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරියාට යොමුකරන අතර පැමිණිල්ල හෝ තොරතුර පිළිබඳ ළමා ආරක්ෂක නිලධාරියාගේ විමර්ශන නිර්දේශය නීති බලාත්මක කිරීමේ ඒකකයට එවනු ලැබේ. මෙම තොරතුරු ලබා ගැනීම සඳහා සහ එම තොරතුරු නිවැරදිව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස එවීම සඳහාවිශේෂ පෝරමයක් 2020 ජුනි මාසයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හඳුන්වා දී ඇත. එය "ළමා අපයෝජන විමර්ශන වාර්තාව"(Child Abuse Investigation Report-CAIR Report) නම් වේ. මෙය මෙම වර්ෂයේදී හඳුන්වාදුන් නව වාර්තා ආකෘතියකි.

## සිද්ධි සම්මන්ත්‍රණ ඇගයීම් වාර්තාව (Case Conference Evaluation Report)

දිවයින පුරා ළමයින් සම්බන්ධයෙන් පවත්වනු ලබන සිද්ධි සම්මන්ත්‍රණවල දී එහි ප්‍රගතිය අධිකාරියට වාර්තා කිරීමට මෙම වාර්තාව හඳුන්වාදී ඇත.

## "ප්‍රථම වාර්තා" (First report)

ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි **"ප්‍රථම වාර්තා" (First report)** පැය 24 ක් ඇතුළත ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනිවාර්යෙන් දැන්විය යුතුය.

මෙම වර්ෂයේදී පොලිස්පතිතුමාට දැන්වීමෙන් පසුව පොලිස්පතිතුමාවිසින් 2020.08.31 වන දින ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් ස්ථාන 494 ටම CRTM 1978 දරණ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව අද වනවිට සෑම පොලිසියකින්ම ප්‍රථම වාර්තා අප අධිකාරියට යොමු කරනු ලබයි.මෙම වර්ෂයේදී ලැබී ඇති ප්‍රථම වාර්තා මුළු සංඛ්‍යාව 222 කි.


එම ප්‍රථම වාර්තා **"පොලිස් පැමිණිලි යාවත්කාලීන හා නියාමනය කිරීමේ පද්ධතියක්" (Police** Complaint update monitoring system/ Police **CUMS)** හරහා ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2020 ජුලි මාසයේ සිට නියාමනය ආරම්භ කරන ලදී.

## ළමා අපයෝජන වින්දිතයන්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ. 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගතකර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම මෙමගින් සිදු කරයි.

2020 වසරේ දී

| | | |
|---|---|---|
| 01 | අධිකාරියට ලැබුණ වීඩියෝ සාක්ෂි ඉල්ලීම් සංඛ්‍යාව | 156 |
| 02 | සිදු කරන ලද වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සංඛ්‍යාව | 89 |
| 03 | අධිකරණය සඳහා මුද්‍රා හැරීම් සංඛ්‍යාව | 54 |
| 04 | අධිකරණ වෙත ලබා දී ඇති වීඩියෝ සාක්ෂියේ වාචික ප්‍රකාශ යතුරු ලියන පිටපත්සංඛ්‍යාව | 40 |



## සයිබර් අවකාශය තුළ ළමා අපයෝජන නිරීක්ෂණ, පරීක්ෂණ සහ මෙහෙයුම්

අන්තර්ජාලය හරහා කරනු ලබන ළමා හිංසන, ලිංගික අපයෝජනවලට පොළඹවා ගැනීම් ආදී ශ්‍රී ලංකාවේ ළමුන්ට එල්ලවී ඇති තර්ජනයන්වලට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2001 වර්ෂයේදී අන්තර්ජාල ළමා අපයෝජන හා හිංසන මැඩලීම සඳහා අන්තර්ජාල විමර්ශන ඒකකයක් නිර්මාණය කර තිබුණි. එම ඒකකය 2020 මාර්තු මස නැවත එය විශේෂ අන්තර්ජාල ආවේක්ෂණ ඒකකයක් බවට පරිවර්තනය කරන ලදී. මේ සඳහා සේව් ද චිල්ඩ්‍රන් ආයතනය සහය ලබාදෙයි.

## නීතිමය කර්තව්‍යන්

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීතිමය පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීති උපදෙස් ලබාදීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම හා ජාතික ළමා ආරකෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් විමර්ශනය කර මහේස්ත්‍රාත් අධිකරණයන්හී ගොනු කරන නඩුවලට අදාළව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු මෙහෙයවීම, වින්දිත ළමුන්හට නොමිලයේ නීතිඥ සහය ලබා ගැනීම සඳහා නීති ආධාර කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණයන් ගොඩනැගීම හා නීති උපදෙස් ලබාදීම යනාදී කාර්යයන් නීති අංශය මඟින් ඉටු කරනු ලබයි.

- **2005**අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත
- **2005** අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

### පැමිණිලි හැසිරවීම සහ කළමනාකරණය

| | |
|---|---|
| 2020 වර්ෂයේ 1929 හරහා නීති අංශයට යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාව | 1013 |
| 2020 වර්ෂයේ 1929 හා අනෙකුත් යොමු වී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව | 1103 |
| දුරකථන මාර්ගයෙන් නීති උපදෙස් ලබාදීම් | 301 |
| නීති අංශයට සේවාලාභීන් පැමිණි විට නීති උපදෙස් ලබාදීම් | 36 |
| 2011 - 2019 අතර වාර්තා වූ පැමිණිලි සඳහා පසුවිපරම් | 790 |
| 2011 – 2020 දක්වා කාලයට අදාළව අවසන් කර ඇති පැමිණිලි ගොනු | 1165 |
| 2020 වර්ෂයේ නීති අංශයට යොමු කළ පැමිණිලි අතුරින් 2020 වර්ෂය තුළ අවසන් කළ පැමිණිලිසංඛ්‍යාව | 226 |
| පැමිණිලි වසා දැමීම සඳහා හෝ අවශ්‍ය කාර්යයන් සිදු කිරිම සඳහා නීතිය බලාත්මක කිරීමේ අංශය වෙත යොමු කරන ලද පැමිණිලි | 1165 |
| නීති අංශයට යොමු කෙරුණු ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි අධ්‍යාපන ආධාර අවශ්‍යතා ඇති ළමයින් සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම | 70 |

### නීතිමය සහය ලබාදීම - (ඍජුව සහ දුරකථන හරහා )

කොවිඩ් 19 තත්ත්වය මත ඵලදායී හා කඩිනම් සේවයක් ජනතාවට ලබා දීමේ අරමුණෙන් මෙය සිදු කරන ලදී.

| | |
|---|---|
| මහජනතාවට හා අධිකාරියේ කාර්ය මණ්ඩලයට නීති උපදෙස් ලබාදිම් | 381 |
| දුරකථන මඟින් සහය | 36 |
| නීති අංශය වෙත පැමිණ ලබා ගත් සහය | 02 |
| උසාවියේ පෙනී සිටීම් | 17 |
| 1929 වෙත යොමු වන නව පැමිණිලි සඳහා නීතිමය සහය ලබාදීම 2020 | 1103 |

**2020 වර්ෂයේදී 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත අනුව නඩු සංඛ්‍යාව**

| අනු අංකය | අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 06 |
| 02 | හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණය | 17 |
| 03 | මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 07 |
| 04 | අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය | 08 |
| 05 | මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණය | 11 |
| 06 | කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| | *මුළු සංඛ්‍යාව* | **51** |


**2020 වසරේ දී නඩු 12ක් සඳහා අධිකරණ පෙනී සිටීම් 15 සිදුකර ඇත.**

**නීති අංශය අධිකරණයන් ඉදිරියේ සිදුකළ පෙනී සිටීම් සංඛ්‍යාව**

| අනු අංකය | අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 03 |
| 02 | ගාල්ල | 01 |
| 03 | මීගමුව | 01 |
| 04 | නුවරඑළිය | 03 |
| 05 | දඹුල්ල | 01 |
| 06 | ගංගොඩවිල | 01 |
| 07 | බත්තරමුල්ල | 02 |
| *මුළු සංඛ්‍යාව* | | **12** |

**විශේෂ පොලිස් විමර්ශන ඒකකයට 1929 ළමා උපකාරක සේවය හරහා හෝ අනෙක් ක්‍රමවලින් වාර්තා වන පැමිණිලි**

| **2020.01.01 දින සිට 2020.12.31දක්වා 1929හෝ අනෙක් ක්‍රම වලින් පැමිණෙන පැමිණිලි** | | **සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | ලැබුණු තොරතුරු ගණන | 5604 |
| 02 | පිට පොලිස් ස්ථානවෙත යොමු කර ඇති තොරතුරු | 5604 |
| 03 | යොමු කරන ලද තොරතුරු සඳහා පිළිතුරු ලැබී ඇති ගණන | 4204 |
| 04 | විමර්ශන ප්‍රගතිය ලබා ගැනීමට ඇති ගණන | 1400 |
| 05 | විමර්ශනය කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 5604 |




**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් ඒකකය හරහා පරීක්ෂණ පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගෙන නඩු පැවරීම**

සමහර අවස්ථාවලදී, ප්‍රාදේශීය පොලිස් පරීක්ෂණ පිළිබඳ සෑහීමකට පත් නොවන විට, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් ඒකකය හරහා පරීක්ෂණ පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගෙන නඩු පැවරීමසිදු කරයි.

1. 2019 වර්ෂයේ නඩු පැවරූ මුළු සංඛ්‍යාව - 12
2. 2020 නඩු පැවරූ මුළු සංඛ්‍යාව-50

| 2020.01.01 දින සිට 2020.12.31දක්වා සිදු කරන ලද රාජකාරිය | | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විශේෂ පොලිස් විමර්ශන ඒකකය මඟින් විමර්ශනයට ලක් කරන ලද බල අපරාධ සංඛ්‍යාව | 35 |
| 02 | විශේෂ පොලිස් විමර්ශන ඒකකය මඟින් විමර්ශනයට ලක් කරන ලද සුළු අපරාධ සංඛ්‍යාව 1995 අංක 22 දරණ ලංකා දණ්ඩ නීති සංග්‍රහ පනත (සංශෝධිත 345) යටතේ ගැනෙන වැරදි | 17 |
| 03 | නීතිපතිතුමාගේ උපදෙස් පතා සකස් කර යොමු කරන උද්‍ධෘත ගොනු ගණන | 20 |
| පවරන ලද මුළු නඩු සංඛ්‍යාව | | 50 |

**විශේෂ පොලිස් විමර්ශන ඒකකය ළමා අපයෝජන සම්බන්ධව අධිකරණවල නඩු ගොනු කිරීමේ කාර්ය සිදු කරයි.**

| 2020.01.01 දින සිට 2020.12.31 දක්වා සිදු කරන ලද රාජකාරිය | | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පිට පළාත්වල මහාධිකරණවල ගොනුකර ඇති නඩු සංඛ්‍යාව | 20 |
| 02 | කොළඹ මහාධිකරණවල ගොනුකර ඇති නඩු සංඛ්‍යාව | 34 |
| 03 | පිට පළාත් මහේස්ත්‍රාත් අධිකරණවල ගොනුකර ඇති නඩු සංඛ්‍යාව | 37 |
| 04 | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකරඇති නඩු සංඛ්‍යාව | 12 |
| 05 | බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකර ඇති නඩු සංඛ්‍යාව | 07 |

**විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ නිලධාරීන් ළමා අපයෝජන සම්බන්ධව අධිකරණ කටයුතු සඳහා පෙනී සිටීම කරයි**

| 2020.01.01 දින සිට 2020.12.31 දක්වා කාර්යභාරය | | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මහාධිකරණ නඩුවලට පෙනී සිටි වාර ගණන | **591** |
| 02 | මහේස්ත්‍රාත් අධිකණ නඩුවලට පෙනී සිටි වාර ගණන | **745** |
| 03 | බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට පෙනී සිටි වාර ගණන | **548** |
| මුළු සංඛ්‍යාව | | **1884** |

**අධිකරණ කටයුතු සම්බන්ධව**

| | | |
|---|---|---|
| 01 | පිට පළාත් මහාධිකරණවල අධිචෝදනා ගොනුකර ඇති ගණන | 20 |
| 02 | කොළඹ මහාධිකරණවල අධි චෝදනා ගොනුකර ඇති ගණන | 34 |
| 03 | පිට පළාත්වල මහේස්ත්‍රාත් අධිකරණවල කරුණු වාර්තා කර ඇති ගණන | 37 |
| 04 | මහාධිකරණවල පෙනී සිටි නඩු ගණන | 54 |
| 05 | මහේස්ත්‍රාත් අධිකරණවල පෙනී සිටි නඩු ගණන | 49 |
| 06 | බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටි නඩු ගණන | 548 |

| | | |
|---|---|---|
| • | විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් විමර්ශනයට ලක්කරන ලද සුළු අපරාධ සංඛ්‍යාව | 12 |
| • | 1995 අංක 22 දරණ ද.නි.ස. (සංශෝධිත) පනතේ 345 යටතට ගැනෙන වැරදි | 22 |
| • | නීතිපතිතුමාගේ උපදෙස් පතා, සකස් කර යොමු කරන ලද උද්‍යත ගොනු ගණන | 54 |
| • | ලැබී ඇති ලිපි සංඛ්‍යාව | 1913 |
| • | ලැබී ඇති ලිපි සම්බන්ධයෙන් ක්‍රියාකර, අවසන්කර, නැවත යොමු කළ සංඛ්‍යාව | 1783 |
| • | මෙහෙයවන ලද වීඩියෝ සම්මුඛ සාකච්ඡා ගණන | 33 |
| • | ලැබී ඇති සිතාසි ගණන | 750 |
| • | ක්‍රියාකර ඇති සිතාසි ගණන | 750 |
| • | ක්‍රියාකර ඇති වරෙන්තු ගණන | 119 |

## 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සංශෝධනය කිරීම

1. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සංශෝධනය කිරීමට අවශ්‍ය අනුමැතිය 2020 ජූලි මාසයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

2. ඒ සඳහා නීති විශාරදයන් 05 දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක දායකත්වය ලබා ගනිමින් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට කඩිනමින් සිදු කරමින් පවතී.

## ළමයින් පිළිබඳව මාධ්‍ය තුළ වාර්තාකරණයේ නීතිමය භාවය පරීක්ෂා කිරීම

ළමයින් පිළිබඳව මාධ්‍ය වාර්තාකරණයේ නීතිමය භාවය පරීක්ෂා කිරීම සහ ගැටළුකාරී, නීතිවිරෝධී මාධ්‍ය වාර්තාකරණයෙන් වැලකීම පිළිබඳව මාධ්‍ය ආයතන වෙත නීතිමය මඟ පෙන්වීම් 02 ක් සිදු කර ඇත.

## වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ වගන්ති අංක 14ට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍ය සඳහන් කර ඇත. එම කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලසුම් මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සිදු කරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත මුදල් ලබා ගත හැකි ආකාර හතරක් පවතියි. එනම්,

1.මහා භාණ්ඩාගාරය මගින්

2.විදේශීය මුදල් ප්‍රතිපාදන මගින්

3.ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුදල මගින්

4.අධිකාරි පනතේ වගන්ති අංක 14ට අනුව සිදු කරන කර්තව්‍ය සඳහා යම් ගෙවීමක් වෙතොත් එම මුදල් රාජ්‍ය නොවන සංවිධානවලින් සිදු කරයි.

ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ මහාභාණ්ඩාගාරය මඟිනි. 2020 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ක්‍රියාකාරී සැලසුම් 3 ක් යටතේ ක්‍රියාත්මක විය.

1. ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුම
2. 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ක්‍රියාකාරි සැලසුම
3. ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරි සැලසුම

මෙහිදී ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුම මහාභාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද මුදල්වලින් ක්‍රියාත්මක විය. 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ක්‍රියාකාරි සැලසුම SAARC අරමුදලින් ක්‍රියාත්මක විය. ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරි සැලසුම සේව් ද චිල්ඩ්රන් ආයතනය විසින් ලබාදුන් අරමුදල්වලින් ක්‍රියාත්මක විය.

සකස් කරන ලද ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්මට අදාළ සියළුම කාර්යයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරයි.

## මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

මෙම රැස්වීම් සෑම මසකම දිස්ත්‍රික් නිලධාරීන් විසින් ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සහභාගී කර ගනිමින් එම දිස්ත්‍රික්කය තුළම සිදු කරයි. දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන් සහ දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් විසින් සියළුම ප්‍රදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සමඟ මෙම රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. 2020 වසරේ දීප්‍රගති සමාලෝචන රැස්වීම් 95 ක් පවත්වා ඇත. (කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධා ඇති විය.)

## දිස්ත්‍රික් නිලධාරීන් සඳහා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

මෙම රැස්වීම් කාර්තුවකට 01 බැගින් සියළුම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන් සහ සියළුම දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් ප්‍රධාන කාර්යාලයට කැඳවාවාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ ප්‍රගතිය සාකච්ඡා කරනු ලබයි. 2020 වසරේදීවැඩසටහන් 01 ක් පවත්වා ඇත. (කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් භෞතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් ZOOM තාක්ෂණය ඔස්සේ ප්‍රගතිය අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.)






## ප්‍රගතිය හා කාර්ය සාධන වාර්තාව

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ වගන්ති අංක 14ට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කර්තව්‍ය සඳහන් කර ඇත. මෙම කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සිදු කරයි. එම ක්‍රියාකාරී සැලසුම්වලට අදාලව, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සපුරාගැනීම සම්බන්ධයෙන් ප්‍රගතිය සහ පසු විපරමක් සිදුකිරීම ප්‍රගතිය හා කාර්යසාධන වාර්තාවෙන් සිදු කරයි.

සෑම වර්ෂයකම කාර්යසාධන වාර්තාවක් සකස් කිරීමසිදු කරනු ලබන්නේ ඉදිරි වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම වෙනුවෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහාය. මෙම වාර්තාව සකස් කළ යුතු ආකෘතිය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය විසින් ලිඛිත දැනුවත් කිරීමක් සිදු කරනු ලබයි. 2018 සහ 2019 වසරවල අතුරු සම්මත අයවැයක් පැවති බැවින් මෙම වාර්තාව සකස් කරන කාල පරාසය වෙනස් විය. (එබැවින් 2018 සහ 2019 වසර දෙකේම ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය ඇතුළත් කාර්යසාධන වාර්තාව සැකසීම සිදු කරන ලදී. සාමාන්‍යයෙන් මෙම කාර්යසාධන වාර්තාවට මුල් මාස 09 යේ ප්‍රගතිය පමණක් මෙම වාර්තාව සඳහා ඇතුළත් කරනු ලබයි.)

මෙය වාර්තාව කොටස් දෙකකින් සමන්විත වෙයි.

01. සිදු කරන ලද කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය ඇතුළත් සංක්ෂිප්ත වාර්තාවක් ඡායාරූප සහිතව සකස් කිරීම.
02. භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය ඇතුළත් දත්ත පමණක් සඳහන් වාර්තාවක් සකස් කිරීම.

## ළමා ආරක්ෂාවට අදාල දැනුම යාවත්කාලීන කිරීම සහ නිලධාරී කුසලතා වර්ධනය කිරීම

ළමා ආරක්ෂාවට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශීය නිලධාරීන් සහ ප්‍රධාන කාර්යාල නිලධාරීන්ගේ දැනුම යාවත් කාලීන කිරීම සිදුකිරීම සෑම මසකම සූම් (Zoom ) තාක්ෂණය ඔස්සේ පැය 03 ක කාලයක් තුළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණුවක් (Continues Professional Development Training - CPD) සිදු කර ඇත.

| අනු අංකය | මාතෘකාව | දිනය | සම්පත්දායකයා හෝ සම්පත්දායක ආයතනය |
|---|---|---|---|
| 01 | 1929 ළමා උපකාරක දුරකතන සේවයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිළිබඳ දුරකථන1929 ක්‍රියාකරුවන් පුහුණු(ZOOM) | 2020.03.20 | සේව් ද චිල්ඩ්‍රන් හා ලීඩ්ස් |
| 02 | මනෝසමාජයීය හා ළමා ආරක්ෂක නිලධාරීන් සඳහා වූ මනෝසමාජයීය ප්‍රථමාධාර පුහුණුව (සිංහල මාධ්‍ය) (ZOOM) | 2020.04.22 | සේව් ද චිල්ඩ්‍රන් හා වර්ල්ඩ් විෂන් |
| 03 | මනෝසමාජයීය හා ළමා ආරක්ෂක නිලධාරීන් සඳහා වූ මනෝසමාජයීය ප්‍රථමාධාර පුහුණුව (දමිළ මාධ්‍ය) (ZOOM) | 2020.04.23 | සේව් ද චිල්ඩ්‍රන් හා වර්ල්ඩ් විෂන් |
| 04 | COVID 19 කාලය තුළ හදිසි ළමා ආරක්ෂක අවශ්‍යතා සමීක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ZOOM) | 2020.05.28 | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමිය, අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ සියළුම අංශ ප්‍රධානීන් |
| 05 | අන්තර්ජාලය තුළ ළමුන්ගේ සුරක්ෂිතතාවය රැක ගැනීම සඳහා ළමා ආරක්ෂක නිලධාරීන් බලගන්වන්නේ කෙසේද (සිංහල මාධ්‍ය) (ZOOM) | 2020 මැයි මස 06, 08, 09 | මදාරා නුවරපක්ෂ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී - කුරුණෑගල |
| 06 | අන්තර්ජාලය තුළ ළමුන්ගේ සුරක්ෂිතතාවය රැක ගැනීම සඳහා ළමා ආරක්ෂක නිලධාරීන් බලගන්වන්නේ කෙසේද (දමිළ මාධ්‍ය) (ZOOM) | 2020.05.13 | මදාරා නුවරපක්ෂ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී - කුරුණෑගල (දමිළ මාධ්‍ය භාෂා පරිවර්තක හරේන්ද්‍ර දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී - නුවරඑළිය) |
| 07 | සයිබර් අවකාශය තුළ ළමා අපයෝජන මැඩලීම සඳහා තාක්ෂණික මඟපෙන්වීම (සිංහල මාධ්‍ය) (ZOOM) | 2020 මැයි මස 06, 08, 09 | අයේෂ් ශ්‍රීනාත් - අන්තර්ජාල අපරාධ - විමර්ෂක සේව් ද චිල්ඩ්‍රන් අනුග්‍රහය |
| 08 | සයිබර් අවකාශය තුළ ළමා අපයෝජන මැඩලීමසඳහා තාක්ෂණික මඟපෙන්වීම (දමිළ මාධ්‍ය) (ZOOM) | 2020.05.13 | අයේෂ් ශ්‍රීනාත්අන්තර්ජාල - - අපරාධ විමර්ෂක සේව් ද චිල්ඩ්‍රන් අනුග්‍රහය (දමිළ මාධ්‍ය භාෂා පරිවර්තක හරේන්ද්‍ර දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී - නුවරඑළිය) |

| අනු අංකය | මාතෘකාව | දිනය | සම්පත්දායකයා හෝ සම්පත්දායක ආයතනය |
|---|---|---|---|
| 09 | අන්තර් පුද්ගල සන්නිවේදනය (ZOOM) | 2020.06.25 | ප්‍රවීන මාධ්‍යවේදී කපිල.එම්.ගමගේ (දමිළ මාධ්‍ය භාෂා පරිවර්තක හරේන්ද්‍ර දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී - නුවරඑළිය) |
| 10 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන මාර්ගගත ODK අධීක්ෂණය සම්බධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කිරීම (සිංහල මාධ්‍ය) (ZOOM) | 2020.07.07 | රෝහණ රණසිංහ - අධ්‍යක්ෂ වැඩසටහන් - |
| 11 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන මාර්ගගත ODK අධීක්ෂණය සම්බධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කිරීම (දමිළ මාධ්‍ය) (ZOOM) | 2020.07.09 | රෝහණ රණසිංහ - අධ්‍යක්ෂ වැඩසටහන් - (දමිළ මාධ්‍ය භාෂා පරිවර්තක හරේන්ද්‍ර දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී - නුවරඑළිය) |
| 12 | නීති බිඳින සහ නීතියට පටහැනි ළමුන් ආරක්ෂා කිරීම (සිංහල මාධ්‍ය) (ZOOM) | 2020.09.23 | වෛද්‍යාහේමමාල් ජයවර්ධන - යුනිසෙෆ් |
| 13 | නීති බිඳින සහ නීතියට පටහැනි ළමුන් ආරක්ෂා කිරීම (දමිළ මාධ්‍ය) (ZOOM) | 2020.09.23 | වෛද්‍යාහේමමාල් ජයවර්ධන - යුනිසෙෆ් (දමිළ මාධ්‍ය භාෂා පරිවර්තක - හරේන්ද්‍ර දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී - නුවරඑළිය) |
| 14 | ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රවේශයන්(ZOOM) | 2020.11.25 | ආචාර්ය චාරිකා මාරසිංහ |
| 15 | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සහ අයිතිවාසිකම් ප්‍රවේශයන් (ZOOM) | 2020.12.02 | රන්ජන් වෙත්තසිංහ- සේව් ද චිල්ඩ්‍රන් |
| 16 | ළමුන් වෙනුවෙන් සිදුකරන කායික දණ්ඩනය - (ZOOM) | 2020.12.16 | මහාචාර්ය ප්‍රියංජලී ද සිල්වා |

## 3.1 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| විස්තරය | සටහන් | 2020 (රුපියල්) | 2019 (රුපියල්) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රදාන මහා භාණ්ඩාගාරය | | 254,708,000.00 | 257,512,685.29 |
| - අනෙකුත් ආයතන | 1A | - | - |
| - අනෙකුත් ආදායම් | 1B | 19,143,869.44 | 24,027,617.79 |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 19,546,813.41 | 54,449,445.60 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1C | - | - |
| **මුළු ආදායම** | | **293,398,682.85** | **335,989,748.68** |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | 2 | 235,815,823.63 | 234,119,826.14 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 60,550,953.74 | 98,969,835.79 |
| ව්‍යාපෘති වියදම් | 4 | - | - |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | - | - |
| මූල්‍ය වියදම් | 6 | - | - |
| **මුළු වියදම්** | | **296,366,777.37** | **333,089,661.93** |
| **කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)** | 7 | **(2,968,094.52)** | **2,900,086.75** |

## 3.2 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | ( රුපියල් ) | ( රුපියල් ) |
|---|---|---|---|
| විස්තරය | සටහන් | **2020** | **2019** |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 58,538,978.40 | 67,929,606.03 |
| කෙරීගෙන යන වැඩ- වව්නියාව ගොඩනැගිල්ල | | - | 3,982,463.55 |
| කල්බදු ඉඩම් | | 20,149,824.31 | 20,928,865.41 |
| ආයෝජන හා ඉතිරිකිරීම් | 9 | 5,830,997.94 | 7,694,089.44 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 58,676.82 | 131,147.25 |
| ව්‍යාපෘති ගිණුම්වල (ඌනතාවය) | 14-A | 602,508.69 | 602,508.69 |
| | | **85,180,986.16** | **101,268,680.37** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 1,422,866.73 | 364,096.06 |
| ආපදා ණය නැවත ගෙවීම් | | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 4,447,066.10 | 8,889,325.37 |
| ඉදිරියට කළ ගෙවීම් | 12 | 521,848.57 | 639,557.47 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 14,108,345.94 | 5,250,317.18 |
| | | **20,970,861.48** | **15,614,030.22** |
| **මුළු වත්කම්** | | **106,151,847.64** | **116,882,710.59** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික වෙන් කිරීම | | 53,637,415.00 | 44,749,353.50 |
| ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය | 14-A | 3,358,669.02 | 3,322,669.02 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 14-B | 584,997.27 | 584,997.27 |
| | | **57,581,081.29** | **48,657,019.79** |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 15 | 6,101,123.80 | 5,876,289.91 |
| කෙටිකාලීන වෙන් කිරීම් | 16 | 2,315,710.64 | 916,094.14 |
| | | **8,416,834.44** | **6,792,384.05** |
| **මුළු වගකීම්** | | **65,997,915.73** | **55,449,403.84** |
| **ශුද්ධ වත්කම්** | | **40,153,931.91** | **61,433,306.75** |
| **මූල්‍යනය වන්නේ** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 17 | 31,979,326.60 | 40,929,636.38 |
| ප්‍රාග්ධන සංචිත | | - | - |
| ප්‍රත්‍යාගණන සංචිත | | 722,241.10 | 1,941,600.05 |
| රඳවාගත් ඉපැයුම් | | 7,452,364,21 | 18,562,070.32 |
| | | **40,153,931.91** | **61,433,306.75** |

## 3.3 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තර තොරතුරු | සටහන් | 2020 (රුපියල් වලින්) | 2019 (රුපියල් වලින්) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වු අතිරික්තය / (ඌනතාවය) | | (2,968,094.52) | 2,900,086.75 |
| <u>පෙර වසරේ ගැලපුම්</u> | | | |
| රඳවාගත් ඉපැයීම් | | (4,159,148.04) | (9,617,822.14) |
| | | | 906,547.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | | - | |
| **මුදල් නොවන සංචලනයන්** | | | |
| ක්ෂයවීම් | 8 | 15,218,792.02 | 21,123.948.16 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | | 779,041.10 | 779,041.10 |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | (14,778,474.17) | (20,683,630.31) |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | - | 1,118,491.78 |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | (1,219,358.95) | 11,600.05 |
| ගෙවියයුතු ගිණුම්වල වැඩිවීම්/(අඩුවීම්) | | 224,833.89 | (12,795,745.17) |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම්/(අඩුවීම්) | | 384,000.00 | (865,940.00) |
| තොග වැඩිවීම්/(අඩුවීම්) | | (1,058,770.67) | 123,406.71 |
| ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම්/(අඩුවීම්) | | 4,442,259.27 | 12,164,424.86 |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/(අඩුවීම්) | | 117,708.90 | 27,169.07 |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 11,939,223.50 | 10,067,119.50 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **8,922,012.33** | **5,258,697.36** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්</u> | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (5,833,714.39) | (2,751,473.00) |
| කෙරීගෙන යන වැඩ- වව්නියාව ගොඩනැගිල්ල | | - | (956,315.41) |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල (වැඩිවීම්/අඩුවීම්) | | 72,470.43 | 369,896.11 |
| ආයෝජන ප්‍රතිලාභ | | 1,863,091.50 | 288,537.21 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,898,152.46)** | **(3,049,355.09)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පාරිතෝෂික ගෙවීම | | (2,035,545.50) | (712,169.00) |
| ඩේලි මිරර් සුනාමි අනුග්‍රාහක ප්‍රතිපාදන | 14 | 36,000.00 | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | 17 | 5,833,714.39 | 365,514.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **3,834,168.89** | **(346,655.00)** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | **8,858,028.76** | **1,862,687.27** |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | **5,250,317.18** | **3,387,629.91** |
| **අවසාන මුදල් සහ මුදල්වලට සමාන දෑ** | **13** | **14,108,345.94** | **5,250,317.18** |

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය (රුපියල්)**

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **61,247,752.69** | **1,930,000.00** | **15,661,983.57** | **78,839,736.26** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | 2,900,086.75 | 2,900,086.75 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20318116.31) | 11,600.05 | | (20,306,516.26) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **40,929,636.38** | **1,941,600.05** | **18,562,070.32** | **61,433,306.75** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | (5,550.00) | - | (8,141,611.59) | (8,147,161.59) |
| **2020 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **40,924,086.38** | **1,941,600.05** | **10,420,458.73** | **53,286,145.16** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය හෝ අලාභය | **-** | **-** | (2,968,094.52) | (2,968,094.52) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (8,944,759.78) | (1,219,358.95) | - | (10,164,118.73) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **31,979,326.60** | **722,241.10** | **7,452,364.21** | **40,153,931.91** |

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - ශ්‍රී ලංකා**

## 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. පොදු තොරතුරු

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර යන ලිපිනයේ පිහිටා ඇත.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත. අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, මෙහි සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සියලුම වර්ෂයන් සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්වය (ශේෂ පත්‍රය), මූල්‍ය කාර්යසාධනය (ආදායම් ප්‍රකාශය), හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ආදිය ඇතුළත් වේ.

### 3. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කෙරේ. 1972 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8(අ)(xxvi) වගන්තිය සහ 42 (ඊ) වගන්තිය මඟින් සලසා ඇති විධිවිධාන යටතේ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය ආදායම් බද්දට යටත් නොවේ. මූල්‍ය ප්‍රකාශ පිරිවැය පදනම යටතේ සකස් කෙරේ.

<u>**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගිණුම් පිළියෙල කිරීමේදී පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.**</u>

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන, අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීම තහවුරු කිරීම සඳහා පොදු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු ආකාරය නිශ්චිතව දක්වයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ඒවායේ ව්‍යුහය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයීම සහ ගිණුම්කරණ උපචිත පදනම යටතේ සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගතය සඳහා වන නියමයන් සම්බන්ධයෙන් සමස්ථ සලකා බැලීම් ඉදිරිපත් කරයි. පිළිගැනීම, මිනුම්ක්‍රම සහ විශේෂිත ගනුදෙනු හෙළිදරව් සහ අනෙකුත් කාරණා මේ යටතට අයත් වේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය මඟින් මුදල් ප්‍රවාහ මූලාශ්‍ර, වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ මුදල් වියදම් කර ඇති අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂය හඳුනාගනියි. ආයතනයක මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වගකීම සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා ප්‍රයෝජනවත් වේ. මුදල් ප්‍රවාහ තොරතුරු මඟින් රාජ්‍ය අංශයේ ආයතනයක් තම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්න සහ එකී මුදල් භාවිතා කරන්නේ කවරාකාරයටද යන්න පිළිබඳ නිශ්චය කිරීම සඳහා පරිශීලකයන්ට අවස්ථාව සලසයි. ආයතනයේ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය ආදී සම්පත් වෙන් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේ දී සහ තොරතුරු ඇගයීමේදී පරිශීලකයන්ට මුදල් ප්‍රවාහ වල කාලය සහ නිශ්චිත බව පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. මෙම ප්‍රමිතයේ අරමුණ වන්නේ මෙහෙයවීම, ආයෝජනය

සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සිදු කරන කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කරනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මඟින් ආයතනයේ මුදල් සහ මුදල් සමාන දෑ වල ඓතිහාසික වෙනස්කම් පිළිබඳව අවශ්‍ය තොරතුරු සැපයීමයි.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ**

මෙම ප්‍රමිතිය මඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ වෙනස් කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම් හෙළිදරව් කිරීම සහ මූල්‍ය ගනුදෙනු මෙහෙයවීම නිශ්චය කිරීමේ දී භාවිතා කළ යුතු රීති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම දෝෂ නිවැරදි කිරීම ආදිය සඳහා නිර්ණායක නියම කරයි. තවද, මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළත්වය සහ විශ්වාසනීය බව ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර, එම මූල්‍ය ප්‍රකාශන කාලානුරූපීව අනෙකුත් ආයතන වල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමට ද උපකාරී වේ.

1. ක්ෂය කිරීම

ඉඩම්, ක්ෂය කිරීම් වලට යටත් නොවේ. අනෙකුත් වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය කරනු ලබයි. යම් දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගත් අවස්ථාවේ සිට එය භාවිතයෙන් ඉවත් කරන තෙක් ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ලී බඩු | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

නිශ්චිත පරිත්‍යාගශීලී නියෝජිතායතන සමඟ අත්සන් තබා ඇති ගිවිසුමට අනුව ව්‍යාපෘති අරමුදල් භාවිතා කර මිලදී ගත් අයිතමයන්, පිරියත සහ උපකරණ කිසිවක් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ ගිවිසුම් වලට ඇතුළත් නොවේ. ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදී ගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ පරිත්‍යාගශීලී නියෝජිතායතනය වෙත අයත්ය. එම උපකරණවල හිමිකාරත්වය ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත පවරන තෙක් ව්‍යාපෘති සඳහා වෙනම වත්කම් ලැයිස්තු පවත්වාගෙන යනු ලැබේ.

2. ක්‍රමක්ෂය

බදු කාල පරිච්ඡේදය පදනම් කරගනිමින් ඉඩම් ක්‍රමක්ෂය කරනු ලැබේ. අනෙකුත් වත්කම් පහත සඳහන් ක්ෂය අනුපාත යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

| <u>ඉඩම් පිළිබඳ තොරතුරු</u> | <u>බදු කාල පරිච්ඡේදය (වර්ෂ)</u> |
|---|---|
| ඉඩම් (2000) | 50 |

| | |
|---|---|
| ඉඩම් (2016) | 30 |

| <u>අනෙකුත් වත්කම්</u> | <u>ක්‍රමක්ෂය අනුපාතය</u> |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ගෘශ භාණ්ඩ | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

**<u>ගිණුම් සඳහා සටහන්</u>**

**<u>සටහන 01:- ක්‍රමක්ෂය</u>**

වන්දි ගෙවීමට අපේක්ෂිත අදාළ පිරිවැය ආයතනය විසින් වියදම් වශයෙන් හඳුනා ගැනෙන අතර ප්‍රදාන, කාල පරිච්ඡේදය පුරා ලාභ හෝ අලාභ පදනම මත හඳුනාගැනේ.

**<u>සටහන 02- අවිනිශ්චිත වගකීම්</u>**

සේවා තහනමකට යටත් කළ සේවකයෙකු සම්බන්ධයෙන් විභාග වන නඩුවට අදාළ අවිනිශ්චිත වගකීම් අධිකාරිය සතුය.

**<u>සටහන 03- විලම්භිත ආදායම්</u>**

2020 ස්ථාවර වත්කම් වලට සාපේක්ෂව වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම, සටහන "1ආ" හි දක්වා ඇති විවිධ ආදායම් ගිණුමට ඇතුළත් කර ඇත.

**<u>සටහන 04- උපචිත වියදම්</u>**

2021.01.31 දිනට වාර්තාගත වූ උපචිත වියදම් පමණක් මුළු උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වේ.

**<u>සටහන 05- පාරිතෝෂික ප්‍රතිපාදන</u>**

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා 2020 වසර සඳහා පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කර ඇත.

**<u>සටහන 06- අවසන් තොග</u>**

ලිපිද්‍රව්‍ය අවසන් තොග "සාමාන්‍ය පිරිවැය පදනම" මත අගය කර ඇත.

## සටහන 07- නොනිමි වැඩ - වවුනියාව ගොඩනැගිල්ල

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අයත් ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ පිරිවැය, වියදම් වශයෙන් හඳුනාගෙන ඇත. එහෙත් හිමිකම පැවරීමේ ලිපිය අධිකාරිය වෙත තවමත් ලැබී නොමැත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| සටහන 1 අ | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **පුනරාවර්තන ප්‍රදාන- අනෙකුත් පරිත්‍යාගශීලී නියෝජිතායතන** | | |
| **එකතුව** | **-** | **-** |

| සටහන 1 ආ | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **අනෙකුත් ආදායම්** | | |
| අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම | 2,218,050.00 | - |
| පොලී ආදායම් | 463,307.03 | 617,817.89 |
| ආපදා ණය පොලී | 7,049.67 | 13,139.32 |
| විවිධ ආදායම් | 457,629.62 | 1,493,671.32 |
| විලම්භිත ආදායම් | 15,997,833.12 | 21,902,989.26 |
| **එකතුව** | **19,143,869.44** | **24,027,617.79** |

| සටහන 1 ආ (1) | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ විස්තර** | | |
| භාර අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම | 1,955,450.00 | - |
| ගාස්තු රහිත පැය 24 සේවය - ක්‍රියාකාරී සැලැස්ම | 262,600.00 | - |
| **එකතුව** | **2,218,050.00** | **-** |

| සටහන 1 ඇ | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **ජාතික ළමා ආරක්ෂණ අරමුදල සඳහා ලැබීම්** | | |
| **එකතුව** | **-** | **-** |

**සටහන 2 - පරිපාලන වියදම්** රු. රු.

| සටහන 2.1 | 2020 | 2019 |
|---|---|---|
| **සේවක පඩිනඩි** | | |
| කාර්යමණ්ඩල මණ්ඩල වැටුප් හා වේතන | 148,092,519.32 | 142,662,401.99 |
| සේ.අ.අ. | 21,631,522.75 | 21,438,343.16 |
| සේ.භා.අ. | 5,407,880.74 | 5,357,881.30 |
| මාසික දීමනා | 2,812,868.21 | 3,489,142.83 |
| විශේෂ දීමනා (Cool Allowance) | 33,653.20 | 55,660.88 |
| අතිකාල | 2,930,772.17 | 2,205,743.76 |
| නිවාඩු දින ගෙවීම් | 145,882.75 | 215,514.92 |
| ජීවන වියදම් දීමනා | 32,033,999.74 | 35,497,216.48 |
| පාරිතෝෂික දායක මුදල් | 11,939,223.50 | 10,067,119.50 |
| වැඩබැලීමේ ගෙවීම් | 2,647,908.50 | 1,283,235.36 |
| ආධුනික පුහුණුවන්නන් සඳහා දීමනා ගෙවීම් | 709,000.00 | 937,000.00 |
| ඉන්ධන සහ වාහන දීමනා | 3,881,895.45 | 4,427,982.58 |
| **එකතුව** | **232,267,126.33** | **227,637,242.76** |

රු. රු.

| සටහන 2.2 | 2020 | 2019 |
|---|---|---|
| **ගමන් වියදම්** | | |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා - දිස්ත්‍රික් නිලධාරීන් | 3,104,666.69 | 4,422,846.10 |
| කාර්යාල කාර්ය මණ්ඩලය | 126,135.00 | 144,075.00 |
| වාහන කුලී ගාස්තු | 317,895.61 | 461,861.82 |
| විදේශ ගමන් | - | 1,453,800.46 |
| **එකතුව** | **3,548,697.30** | **6,482,583.38** |

**සටහන 3 - අනෙකුත් මෙහෙයුම් වියදම්** රු. රු.

| සටහන 3.1 | 2020 | 2019 |
|---|---|---|
| **සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය** | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 2,399,326.49 | 4,314,177.00 |
| දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ලිපිද්‍රව්‍ය | 1,727,960.90 | 900,276.93 |
| පුවත්පත් | 145,310.00 | 218,610.00 |
| ඉන්ධන | 912,800.00 | 475,720.00 |
| **එකතුව** | **5,185,397.39** | **5,908,783.93** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.2** | **2020** | **2019** |
| **නඩත්තු වියදම්** | | |
| මෝටර් රථ | 1,337,291.20 | 2,238,848.05 |
| පරිගණක සහ උපකරණ | 1,455,881.81 | 1,411,193.44 |
| ගොඩනැගිල්ල සහ කාර්යාලය | 581,601.18 | 261,648.85 |
| **එකතුව** | **3,374,774.19** | **3,911,690.34** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.3** | **2020** | **2019** |
| **කොන්ත්‍රාත්ගත සේවා** | | |
| දුරකථන ගාස්තු | 3,826,574.34 | 4,121,693.49 |
| මුද්දර සහ තැපැල් ගාස්තු | 372,832.68 | 727,047.00 |
| විදුලිය | 2,522,676.28 | 2,957,809.15 |
| ජල ගාස්තු | 172,641.10 | 168,781.18 |
| රක්ෂණය | 758,092.02 | 876,771.61 |
| ආරක්ෂක සේවා | 2,753,502.39 | 2,750,606.27 |
| සනීපාරක්ෂක සේවා | 1,419,272.11 | 1,664,521.02 |
| ප්‍රචාරණය | 1,718,820.00 | - |
| මුද්‍රණ ගාස්තු | 9,630.00 | 21,014.35 |
| පරිවර්තන ගාස්තු | 56,745.00 | 19,457.50 |
| වරිපනම් සහ බදු | 124,846.38 | 26,038.78 |
| විගණන ගාස්තු | 384,000.00 | 400,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 595,338.50 | 478,915.60 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 3,765.00 | - |
| විගණන හා කළමනාකරණ කමිටුව | 38,443.00 | 97,611.00 |
| වෙබ් අඩවි නඩත්තුව | 213,840.00 | 244,240.26 |
| සේවා ගිවිසුම - පරිගණක සහ අනෙකුත් | 420,879.57 | 899,077.11 |
| **එකතුව** | **15,391,898.37** | **15,453,584.32** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.4** | **2020** | **2019** |
| **ක්ෂය/ක්‍රමක්ෂය** | | |
| බදු දේපළ | 779,041.10 | 779,041.10 |
| ගොඩනැගිලි | 1,050,872.85 | 1,050,872.85 |
| මෝටර් රථ | 4,794,500.00 | 4,794,500.00 |
| ලී බඩු | 2,034,176.11 | 2,068,061.94 |
| උපකරණ | 6,147,636.84 | 10,090,661.19 |
| SAIEVAC ව්‍යාපෘතිය | | |
| - ගෘහ භාණ්ඩ | 7,914.72 | 11,872.13 |
| - උපකරණ | 10,025.70 | 13,663.55 |
| UNDP ලී බඩු | 3,311.28 | 4,966.92 |
| UNICEF ව්‍යාපෘතිය | | |
| -මෝටර් රථ | 806,700.00 | 806,700.00 |
| - උපකරණ | 140,713.63 | 2,071,349.58 |
| GIZ -මෝටර් රථ | 211,300.00 | 211,300.00 |
| **SAVE THE CHILDREN** -උපකරණ | 11,640.89 | - |
| **එකතුව** | **15,997,833.12** | **21,902,989.26** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.5** | **2020** | **2019** |
| **අනෙකුත් මෙහෙයුම් වියදම්** | | |
| විවිධ වියදම් | 177,938.54 | 342,674.90 |
| සභාපති - සංග්‍රහ වියදම් | 570,139.70 | 910,418.85 |
| **එකතුව** | **748,078.24** | **1,253,093.75** |

| සටහන 3.6 | 2020 | 2019 |
| --- | --- | --- |
| **NPA - ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ වියදම්** | | |
| ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ න්‍යාය පත්‍රය | 640,460.00 | 2,715,797.52 |
| පාසල් ළමා ආරක්ෂක කමිටු (SCPC) | 724,682.50 | 2,738,686.23 |
| ප්‍රජාපාදක වැඩසටහන් (CBE) | 65,065.00 | 3,672,272.26 |
| ළමා ආරක්ෂණය, ළමා අයිතිවාසිකම් සහ ළමා සංවර්ධනය පිළිබඳ පුහුණුව | 3,547,240.39 | 5,156,574.71 |
| තොරතුරු අධ්‍යාපන සහ සන්නිවේදන උපකරණ (IEC Tools) | 2,985,727.24 | 3,978,678.00 |
| දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රචාරණය | 43,165.00 | 2,192,021.06 |
| නීති තෘත්‍යයන් | 2,469,472.11 | 5,665,853.72 |
| ළමා ආරක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම | 2,528,216.55 | 6,835,837.28 |
| වෙනත් | 1,304,110.80 | 1,492,232.95 |
| NCPA තාක්ෂණික සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු | - | 429,194.62 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සහ හැකියාවන් ඉහළ නැංවීම | 3,326,782.84 | 2,722,586.24 |
| NCPA **ළමයින් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම** | 1,955,450.00 | 4,804,152.19 |
| ගාස්තු රහිත පැය 24 ක ළමා උපකාරක සේවාව | 262,600.00 | 1,558,643.75 |
| ජනපවුර වියදම් | - | 6,577,163.66 |
| **එකතුව** | **19,852,972.43** | **50,539,694.19** |

| | රු. | රු. |
| --- | --- | --- |
| **සටහන 4** | **2020** | **2019** |
| **ව්‍යාපෘති වියදම්** | | |
| **එකතුව** | - | - |

| | රු. | රු. |
| --- | --- | --- |
| **සටහන 5** | **2020** | **2019** |
| **ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම්** | | |
| **එකතුව** | - | - |

| සටහන 6 | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **මූල්‍ය පිරිවැය** | | |
| බැංකු ගාස්තු | - | - |
| **එකතුව** | **-** | **-** |

| සටහන 7 | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)- භාණ්ඩාගාරය | (2,968,094.52) | 2,900,086.75 |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) - ව්‍යාපෘති | - | - |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) - NCPF | - | - |
| **එකතුව** | **(2,968,094.52)** | **2,900,086.75** |

| සටහන 8 | | | | | රු. |
|---|---|---|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 2020/1/1 දිනට ඉ/ගෙ ශේෂය | එකතු කිරීම | ඉවත් කිරීම් | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2020/12/31 දිනට ප/ගෙ ශේෂය |
| **පිරිවැය/තක්සේරු කිරීම** | | | | | |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | | | |
| ගොඩනැගිලි | 52,543,643.30 | - | - | - | 52,543,643.30 |
| මෝටර් රථ | 48,155,825.00 | - | - | - | 48,155,825.00 |
| ගෘහ භාණ්ඩ | 14,659,819.22 | 1,381,692.60 | - | - | 16,041,511.82 |
| උපකරණ | 51,953,295.83 | 4,318,041.79 | - | - | 56,271,337.62 |
| | **167,312,583.35** | **5,699,734.39** | **-** | **-** | **173,012,317.74** |
| **ව්‍යාපෘති වලින් ලත් ස්ථාවර වත්කම්** | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO - ළමා ශ්‍රමය වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO - පරියේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 2,121,560.00 | - | - | - | 2,121,560.00 |
| SAIEVAC ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | - | - | - | 79,147.50 |
| - උපකරණ | 85,757.00 | - | - | - | 85,757.00 |
| UNDP ගෘහ භාණ්ඩ | 33,112.80 | - | - | - | 33,112.80 |
| UNICEF ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර් රථ | 10,599,711.00 | - | - | - | 10,599,711.00 |
| - උපකරණ | 8,660,634.68 | - | - | - | 8,660,634.68 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | - | - | - | 2,113,000.00 |
| SAVE THE CHILDREN - උපකරණ | - | 133,980.00 | - | - | 133,980.00 |
| | **28,319,665.63** | **133,980.00** | **-** | **-** | **28,453,645.63** |
| **එකතුව** | **195,632,248.98** | **5,833,714.39** | **-** | **-** | **201,465,963.37** |

| සටහන 8 තවදුරටත් | | | | | රු. |
|---|---|---|---|---|---|
| ක්ෂය වෙන්කිරීම් | **2020/1/1** දිනට ඉ/ගෙ ශේෂය | **2020** වසර සඳහා ක්ෂය ප්‍රතිපාදන | ඉවත් කිරීම් | පූර්ව වර්ෂයේ ගැලපීම් | **2020/12/31** දිනට ප/ගෙ ශේෂය |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | | | | | |
| ගොඩනැගිලි | 14,258,659.37 | 1,050,872.85 | - | - | 15,309,532.22 |
| මෝටර් රථ | 38,262,639.20 | 4,794,500.00 | - | - | 43,057,139.20 |
| ගෘහ භාණ්ඩ | 9,140,263.59 | 2,034,176.11 | - | - | 11,174,439.70 |
| උපකරණ | 40,729,116.85 | 6,147,636.84 | - | - | 46,876,753.69 |
| | **102,390,679.01** | **14,027,185.80** | - | - | **116,417,864.81** |
| ව්‍යාපෘති වලින් ලත් ස්ථාවර වත්කම් | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO ළමා ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 2,121,560.00 | - | - | - | 2,121,560.00 |
| **SAIEVAC** ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 71,232.78 | 7,914.72 | - | - | 79,147.50 |
| - උපකරණ | 62,681.30 | 10,025.70 | - | - | 78,257.00 |
| **UNDP** ගෘහ භාණ්ඩ | 29,801.52 | 3,311.28 | - | - | 33,112.80 |
| **UNICEF** ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර් රථ | 8,759,511.00 | 806,700.00 | - | - | 9,566,211.00 |
| - උපකරණ | 8,161,334.69 | 140,713.63 | - | - | 8,302,048.32 |
| **GIZ -** මෝටර් රථ | 1,479,100.00 | 211,300.00 | - | - | 1,690,400.00 |
| **SAVE THE CHILDREN -** උපකරණ | - | 11,640.89 | - | - | 11,640.89 |
| | **25,311,963.94** | **1,191,606.22** | - | - | **26,509,120.16** |
| එකතුව | **127,702,642.95** | **15,218,792.02** | - | - | **142,926,984.97** |

| සටහන 8 තවදුරටත් | | | රු. |
|---|---|---|---|
| ශුද්ධ පොත් අගයන් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ පොත් අගය |
| **NCPA** | | | |
| ගොඩනැගිලි | 52,543,643.30 | 15,309,532.22 | 37,234,111.08 |
| මෝටර් රථ | 48,155,825.00 | 43,057,139.20 | 5,098,685.80 |
| ගෘහ භාණ්ඩ | 16,041,511.82 | 11,174,439.70 | 4,867,072.12 |
| උපකරණ | 56,271,337.62 | 46,876,753.69 | 9,394,583.93 |
| | **173,012,317.74** | **116,417,864.81** | **56,594,452.93** |
| **ව්‍යාපෘති වලින් ලත් ස්ථාවර වත්කම්** | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | 501,446.00 | - |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | 754,701.00 | - |
| නීති විරෝධී පිළිබඳ ILO ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | 6,969.00 | - |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | 2,232,158.65 | - |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | 1,035,193.00 | - |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | 96,275.00 | - |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 2,121,560.00 | 2,121,560.00 | - |
| SAIEVAC ව්‍යාපෘතිය | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | 79,147.50 | - |
| - උපකරණ | 85,757.00 | 78,257.00 | 7,500.00 |
| UNDP ගෘහ භාණ්ඩ | 33,112.80 | 33,112.80 | - |
| UNICEF ව්‍යාපෘතිය | | | |
| - මෝටර් රථ | 10,599,711.00 | 9,566,211.00 | 1,033,500.00 |
| - උපකරණ | 8,660,634.68 | 8,302,048.32 | 358,586.36 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | 1,690,400.00 | 422,600.00 |
| SAVE THE CHILDREN - උපකරණ | 133,980.00 | 11,640.89 | 122,339.11 |

| | | | |
|---|---|---|---|
| | **28,453,645.63** | **26,509,120.16** | **1,944,525.47** |
| එකතුව | **201,465,963.37** | **142,926,984.97** | **58,538,978.40** |

| සටහන 8.1 | | | | | | රු. |
|---|---|---|---|---|---|---|
| කල්බදු දේපළ | කල් බදු කාලපරිච්ඡේදය (වර්ෂ) | බදු පිරිවැය | පසුගිය වර්ෂය සඳහා සමුච්චිත ක්‍රමක්ෂය | ඉ/ගෙ ශේෂය | 2020 වර්ෂය සඳහා ක්‍රමක්ෂය වෙන් කිරීම් | ප/ගෙ ශේෂය |
| කල්බදු දේපළ (2000) | 50 | 8,422,459.89 | 3,368,983.96 | 5,053,475.93 | 168,449.20 | **4,885,026.73** |
| කල්බදු දේපළ (2016) | 30 | 18,317,757.08 | 2,442,367.60 | 15,875,389.48 | 610,591.90 | **15,264,797.58** |
| | | **26,740,216.97** | **5,811,351.56** | **20,928,865.41** | **779,041.10** | **20,149,824.31** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 9** | **2020** | **2019** |
| **ආයෝජන සහ ඉතිරි කිරීම්** | | |
| පාරිතෝශිත අරමුදල් ආයෝජන ගිණුම - 261605 | 1,192,339.02 | 926,575.67 |
| සුනාමි ඉතුරුම් ගිණුම - 679016 | 58,764.34 | 430,070.79 |
| ස්ථාවර තැන්පතු | 4,579,894.58 | 6,337,442.98 |
| **එකතුව** | **5,830,997.94** | **7,694,089.44** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 10** | **2020** | **2019** |
| **දිගු කාලීන ලැබීම්** | | |
| ආපදා ණය | 58,676.82 | 131,147.25 |
| **එකතුවන** | **58,676.82** | **131,147.25** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 11** | **2020** | **2019** |
| **ලැබිය යුතු ගිණුම්** | | |
| මනෝ සමාජීය වැඩසටහන් - UNICEF | 235,379.00 | 235,379.00 |
| උත්සව අත්තිකාරම් | 196,500.00 | 263,500.00 |
| මුදල් අත්තිකාරම් | 1,454,621.96 | 5,419,369.22 |
| Save the Children අරමුදල ප්‍රතිපූරණය කිරීම | 256,509.99 | 256,509.99 |
| ලැබිය යුතු ගිණුම් | 2,217,392.04 | 2,344,671.05 |
| ලැබිය යුතු ආපදා ණය | 86,663.11 | 369,896.11 |
| **එකතුව** | **4,447,066.10** | **8,889,325.37** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 12** | **2020** | **2019** |
| **පූර්ව ගෙවීම්** | | |
| රක්ෂණය | 345,562.31 | 443,287.37 |
| සේවා ගිවිසුම | 176,286.26 | 196,270.10 |
| **එකතුව** | **521,848.57** | **639,557.47** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 13** | **2020** | **2019** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම 228076 | 10,836,344.19 | 2,014,315.43 |
| - ජංගම ගිණුම 71252941 | 2,378,477.01 | 2,378,477.01 |
| මහජන බැංකුව -ජංගම ගිණුම 174-1-001-4-0347385 | 893,524.74 | 857,524.74 |
| **එකතුව** | **14,108,345.94** | **5,250,317.18** |

සටහන - **14 A**

**ව්‍යාපෘති අරමුදල් ශේෂ -විස්තරය**

රු.

| ව්‍යාපෘතියේ නම | ඉ/ගෙ ශේෂය | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2020 | | ප/ගෙ ශේෂය |
|---|---|---|---|---|---|
| | | | අරමුදල්/ලැබීම් | වියදම් | |
| සුනාමි අනුග්‍රාකත්වය - Daily Mirror | 857,524.74 | - | 36,000.00 | - | 893,524.74 |
| ඉතාලි ව්‍යාපෘතිය | 128,493.81 | - | - | - | 128,493.81 |
| UNICEF- IDP | 42,815.07 | - | - | - | 42,815.07 |
| Save the Children | 1,281,816.93 | - | - | - | 1,281,816.93 |
| SAIEVAC | 507,717.94 | - | - | - | 507,717.94 |
| Child Fund | 504,300.53 | - | - | - | 504,300.53 |
| **උප එකතුව** | **3,322,669.02** | **-** | **36,000.00** | **-** | **3,358,669.02** |
| GIZ | (22,723.70) | - | - | - | (22,723.70) |
| UNICEF ක්‍රියාකාරී සැලැස්ම | (557,913.17) | - | - | - | (557,913.17) |
| Save the Children USAID | (21,871.82) | - | - | - | (21,871.82) |
| **උප එකතුව** | **(602,508.69)** | **-** | **-** | **-** | **(602,508.69)** |
| **එකතුව** | **2,720,160.33** | **-** | **36,000.00** | **-** | **2,756,160.33** |

සටහන **-14 B**

**ජාතික ළමා ආරක්ෂක අරමුදල -ශේෂය** රු.

| අරමුදල | ඉ/ගෙ ශේෂය | පූර්ව වර්ෂය | ලැබීම් ( සටහන- **1C**) | වියදම් (සටහන **12**) | අතිරික්තය/ (හිඟය) **2020** වසර සඳහා | ප/ගෙ ශේෂය |
|---|---|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 584,997.27 | - | - | - | - | 584,997.27 |

| සටහන 15 | රු. 2020 | රු. 2019 |
|---|---:|---:|
| **උපචිත වියදම්** | | |
| අතිකාල | 586,924.45 | 206,569.78 |
| වැටුප් | - | - |
| ආරක්ෂක සේවා | 338,860.77 | 388,137.95 |
| සනීපාරක්ෂක සේවා | 96,350.41 | 142,484.17 |
| ගෙවිය යුතු සේ.අ.අ. | - | - |
| ගෙවිය යුතු සේ.භා.අ | - | - |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 1,226,075.00 | 1,146,212.21 |
| විදුලි වියදම් | 205,205.60 | 219,690.42 |
| ජලය | 5,200.70 | 2,132.02 |
| ලිපිද්‍රව්‍ය | 50,000.00 | 138,000.00 |
| NCPF වෙතින් NCPA වෙත ගෙවිය යුතු ගෙවීම් | - | - |
| ප්‍රචාරණය | 847,800.00 | - |
| දුරකථන වියදම් | 345,678.55 | 340,229.44 |
| විවිධ ණයහිමියෝ | 2,122,462.50 | 3,131,729.27 |
| වෙබ් අඩවි නඩත්තුව | 17,820.00 | 17,820.00 |
| පුවත්පත් වියදම් | 10,500.00 | 14,890.00 |
| නිවාඩු දින ගෙවීම් | - | 29,644.65 |
| ආධුනිකයන් පුහුණු කිරීම සඳහා දීමනා | 48,000.00 | 80,750.00 |
| විවිධ වියදම් | - | 18,000.00 |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම 2.1.7 | 16,900.00 | - |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම 4.1.1 | 144,500.00 | - |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම 7.1.1 | 29,919.27 | - |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම 7.1.3 | 586.56 | - |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම 7.1.4 | 8,339.99 | - |
| **එකතුව** | **6,101,123.80** | **5,876,289.91** |

| සටහන 16 | රු. 2020 | රු. 2019 |
|---|---:|---:|
| **කෙටි කාලීන වෙන් කිරීම්** | | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 829,360.00 | 445,360.00 |
| ආපදා ණය ආපසු ගෙවීම් සඳහා වෙන් කිරීම් | 470,734.14 | 470,734.14 |
| කෙටි කාලීන පාරිතෝෂිත අරමුදල් සඳහා වෙන් කිරීම් | 1,015,616.50 | - |
| එකතුව | **2,315,710.64** | **916,094.14** |

රු.

| සටහන 17 | **2020/1/1** දිනට ඉ/ගෙ ශේෂය | **2020** වසර සඳහා ලැබීම් | **2020** වසර සඳහා වියදම් | පූර්ව වර්ෂයේ ගැලපීම් | **2020/12/31** දිනට ප/ගෙ ශේෂය |
|---|---|---|---|---|---|
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | | | |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | | | | | |
| රජයේ ප්‍රදාන- ප්‍රාග්ධනය | 10,916,467.00 | 5,453,186.59 | (12,486,964.38) | - | 3,882,689.21 |
| බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලය - ගොඩනැගිලි | 10,840,974.72 | - | (338,780.46) | - | 10,502,194.26 |
| UNICEF - ප්‍රදාන | 2,339,499.99 | - | (947,413.63) | - | 1,392,086.36 |
| GIZ - ප්‍රදාන | 633,900.00 | - | (211,300.00) | - | 422,600.00 |
| SAIEVAC - ප්‍රාග්ධන ප්‍රදාන | 20,740.42 | - | (15,190.42) | (5,550.00) | - |
| UNDP - ප්‍රාග්ධන ප්‍රදාන - | 3,311.28 | - | (3,311.28) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කර ගැනීමේ/සංවර්ධනය කිරීමේ කටයුතු | 299,353.50 | - | (143,075.75) | - | 156,277.75 |
| ප්‍රාග්ධන ප්‍රදාන - කල්බදු දේපළ | 15,875,389.47 | - | (610,591.90) | - | 15,264,797.57 |
| SAVE THE CHILDREN - ප්‍රාග්ධන ප්‍රදාන - | - | 133,980.00 | (11,640.89) | - | 122,339.11 |
| අමාත්‍යාංශ ප්‍රදාන (ප්‍රාග්ධන අත්පත් කර ගැනීම් ) | - | 246,547.80 | (10,205.46) | - | 236,342.34 |
| **එකතුව** | **40,929,636.38** | **5,833,714.39** | **(14,778,474.17)** | **(5,550.00)** | **31,979,326.60** |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විචිවයි/ඕ/එන්සීපීඒ/2020/01/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූනි 14 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් තුළ දී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන තැන්පතු ජංගම වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද වටිනාකම රු.4,579,895 ක් වූ ඉදිරි මාස 06 කින් කල් පිරෙන ස්ථාවර තැන්පතුවක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.34,164,697 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය ඉදිරිපිට පැවති පැරණි මායිම් තාප්පය වෙනුවට නව මායිම් තාප්පය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය දක්වා වැය කර තිබුණු එකතුව රු.5,754,823 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර පැරණි මායිම් තාප්පයේ වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

## 1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්

කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වා ගෙන ගොස් ඇති බව,

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2 (උ) ඡේදය හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව,

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

- ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස පාසල් සිසුන් ප්‍රවාහන සේවය විධිමත් කිරීම හඳුනා ගෙන ඒ පිළිබඳ අවධානය යොමු කර සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එම ක්‍රියාමාර්ග අධිකාරිය වෙත දන්වා සිටින ලෙසත්, 2015 මාර්තු 26 දිනැති ලිපියකින්

අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා තිබුණ ද, ඒ පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| | බලතල, කර්තව්‍යය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|---|
| | 1998 අංක 58 දරන ජාතික ළමා ආරක්ෂක පනත | |
| (අ) | පනතේ (අ) (ඇ) (ඊ) වගන්ති ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්ති සකස් කිරීම | අධිකාරිය පිහිටුවා වසර 20 ක් ගත වූ පසුව 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී ඇති ජාතික ළමා ආරක්ෂක ජාතික ප්‍රතිපත්තිය 2021 මාර්තු 29 විගණිත දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීමේ කාර්යයන් ඇතුළු ඊට අනුශාංගික කාර්යයන් ද ඉටු වී නොතිබුණි. |
| (ආ) | (ඔ) වගන්තිය | |
| | ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීමේ ක්‍රියාපටිපාටි සකස් කිරීම | 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී ඇති පැමිණිලි සංඛ්‍යාව 89,405 කින් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ පැමිණිලි සංඛ්‍යාව 40,668 ක් වූ අතර, මෙම පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | (ක) වගන්තිය | |
| | ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම | අධිකාරිය පිහිටුවා වසර 21 ක් ගත වී ඇතත් පනත ප්‍රකාරව ජාතික දත්ත පදනමක් සකස් කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඵ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් 365 ක් සඳහා රු. 3,690,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඉන් රු. 17,000 ක් පමණක් වැය කර එක් පුහුණු වැඩ සටහනක් පමණක් පවත්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ ව්‍යාපෘති ඌනතාවයක් ලෙස එකතුව රු.602,509 ක් හා ජංගම නොවන වගකීම් යටතේ ව්‍යාපෘති අතිරික්තයක් ලෙස එකතුව රු.3,358,669 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව දක්වා තිබුණි.

(ඇ) ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේ දී ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවන ලද අතර, 2021 මාර්තු 29 වන විගණිත දින වන විට මෙම අරමුදලෙහි රු.2,378,477 ක ශේෂයක් පැවතියද 2018 වර්ෂයේ සිට අදාළ අරමුණු වෙනුවෙන් වැය කර නොතිබුණි.

(ඈ) කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ ළමයාට සිදුවන කායික හා මානසික බලපෑම සහ සමාජ වගකීම විදහා දැක්වෙන ආකාරය පාදක කර ගනිමින් ඒකාංගික ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් රු.250,000 ක් වැය කර තිබුණ ද, විගණිත දිනය වන 2021 මාර්තු 30 දින විටත් මෙම නාට්‍ය විකාශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) අධිකාරිය විසින් 2019 වර්ෂය තුළ දී තේමාවන් 03 ක් ඔස්සේ අත්පොත් 8,500 ක් මුද්‍රණය කිරීම සඳහා රු.4,056,501 ක් වැය කර තිබුණද ඉන් පිරිවැය රු. 3,245,200 ක් වූ පොත් 6,800 ක් විගණිත දිනය වන 2021 මාර්තු 08 දින වන විටත් බෙදා හැරීමකින් තොරව ගබඩා කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

8

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 89% - 75% | 74% - 50% |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | 100% | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් මුද්‍රණය කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | 909% | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | - | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති සංඛ්‍යාව | - | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ සහ අධ්‍යයන සංඛ්‍යාව | - | - | - |
| පාසල් ළමා ආරක්ෂක කමිටු සංඛ්‍යාව | - | - | - |
| නියාමනය කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | 100% | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | - | - | 18% |
| ළමා ආරක්ෂක සේවාව ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | 73% |
| ළමා ආරක්ෂාව සම්බන්ධ නඩුවලටපෙනී සිටීම් සංඛ්‍යාව | 723% | - | - |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | | | 67% |
| ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | 60% |
| වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සංඛ්‍යාව | 111% | - | - |
| ළමා ආරක්ෂණ සේවා සඳහා අවම ප්‍රමිතීන් | 100% | - | - |

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 49% - 50% | 50% - 74% | 75% - 100% |
| **05- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලබා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම** | 5.2 මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන් ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හී | 5.2.2 වයස සහ සිදුවූ ස්ථානය අනුව පසුගිය මාස 12 තුළ දී හිතෛෂී සහකරුවා හැර සෙසු පුද්ගලයන් | 19% | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිදුවන්නාවූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | අතින් ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන් සහ වයස අවු: 15 ට වැඩි ගැහැණු දරුවන්ගේ ප්‍රමාණය | | | |
| **08-** **සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | 8.7 බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායි ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කූට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුලත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වනවිට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1 ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | 13% | | |
| **16-** **තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සැම මට්ටමක ම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම** | 16.2 ළමුන් කෲර වධ හිංසා කිරීම් වලට සහ අපයෝජනයට,සූරාකෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරගේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම | 16.2.1 පසුගිය මාසයක කාලසීමාව තුළ දී සිටි රැකවලුන් අතින් කායික දඬුවම් /හෝ මානසික ප්‍රචණ්ඩත්වයන් අත්විඳීමට සිදු වූ වයස අවු 1-17 දක්වා ළමුන්ගේ ප්‍රමාණය | 35% | 53% | |

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින් විස්තර කරන්න.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන්නාවූ පැමිණිලි පදනම් කර ගනිමින් ජයග්‍රහණ ඉලක්ක ළඟා කර ගැනීම මූලිකව සිදු වේ.මෙහිදී අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යමණ්ඩල පුරප්පාඩු මෙම පැමිණිලි පිළිබඳ තොරතුරු සොයා බැලීමේදී කඩිනම් ප්‍රතිඵල ළඟා කර ගැනීම අපේක්ෂිත අයුරින් සිදු කර ගැනීමේදී දුෂ්කරතා පැන නගී. ලැබෙන පැමිණිලිවල තොරතුරුවල ප්‍රමාණවත් බව සහ සත්‍ය අසත්‍යතාවය ජයග්‍රහණ ළඟා කර ගැනීමේදී බලපායි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 18 | 12 | 06 |
| තෘතීක | 11 | 06 | 05 |
| ද්විතීක | 506 | 317 | 189 |
| ප්‍රාථමික | 13 | 09 | 04 |
| **මුළු සංඛ්‍යාව** | 548 | 344 | 204 |

6.2 ** ආයතනයේකාර්යසාධනයඋදෙසාමානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පවතින්නේ මානව සම්පත් හිඟයකි. මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය උදෙසා සෘණාත්මක බලපෑමක් ඇතිකරයි. ආයතනයේ දැක්ම හා මෙහෙවර වෙනුවෙන් වාර්ෂිකව සැලසුම් කරනු ලබන කාර්යයන් ඵලදායිව ඉටුකරගැනීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් තිබිම අත්‍යවශ්‍ය කරුණකි.

මානව සම්පත් හිඟය හේතුවෙන් ආයතනය විසින් සැලසුම් කරන ලද කාර්යයන් පවතින කාර්ය මණ්ඩල විසින් ඉටුකරගැනිමේදි සේවකයින් අනවශ්‍ය ලෙස පිඩනයට පත්විම සිදුවිම හේතුවෙන් ඔවුන් විසින් ඉටුකරනු ලබන කාර්යයන් ඵලදායි නොවිම ආයතනයේ කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට ළඟාකර ගැනිම කෙරෙහි සෘණ බලපෑමක් එල්ලවේ. එමෙන්ම මානව සම්පත් හිඟවන විට ආයතනයට අවශ්‍ය දක්ෂතා හා නිපුණතාවයන්ගෙන් යුත් සේවක පිරිස හිඟවිම සිදුවන අතර එය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි සෘණ බලපෑමක් ඇතිකරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම(Zoom තාක්ෂණය භාවිතයෙන් සිදු කරන ලදී) | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ත ආයෝජනය (මි.රු) | | වැඩසටහනේ ස්වභාවය දේශීය විදේශීය |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| 1929 ළමා උපකාරක දුරකතන සේවයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිළිබඳ දුරකථන1929 ක්‍රියාකරුවන් වපුහුණු | 8 | පැය 02 | - | - | දේශීය |
| මනෝසමාජයීය හා ළමා ආරක්ෂක නිලධාරීන් සඳහාවූ මනෝසමාජයීය ප්‍රථමාධාරපුහුණුව (සිංහල මාධ්‍ය) | 150 | | | | |
| මනෝසමාජයීය හා ළමා ආරක්ෂක නිලධාරීන් සඳහාවූ මනෝසමාජයීය ප්‍රථමාධාරපුහුණුව (දමිළ මාධ්‍ය) | 50 | | | | |
| COVID 19 කාලය තුළ හදිසි ළමා ආරක්ෂක අවශ්‍යතාසමීක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 200 | | | | |
| අන්තර්ජාලය තුළළමුන්ගේ සුරක්ෂිතතාවය රැක ගැනීම සඳහා ළමා ආරක්ෂක නිලධාරීන් බලගන්වන්නේ කෙසේද (සිංහල මාධ්‍ය) | 165 | | | | |
| අන්තර්ජාලය තුළළමුන්ගේ සුරක්ෂිතතාවය රැක ගැනීම සඳහා ළමා ආරක්ෂක නිලධාරීන් බලගන්වන්නේ කෙසේද (දමිළ මාධ්‍ය) | 60 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| සයිබර් අවකාශය තුළ ළමා අපයයෝජන මැඩලීම සඳහා තාක්ෂණික මඟපෙන්වීම(සිංහල මාධ්‍ය) | 150 | | | | |
| සයිබර් අවකාශය තුළ ළමා අපයයෝජන මැඩලීමසඳහා තාක්ෂණික මඟපෙන්වීම (දමිළ මාධ්‍ය) | 50 | | | | |
| අන්තර් පුද්ගල සන්නිවේදනය | 150 | | | | |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන මාර්ගගත ODK අධීක්ෂණය සම්බධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කිරීම (සිංහල මාධ්‍ය) | 150 | | | | |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන මාර්ගගත ODK අධීක්ෂණය සම්බධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කිරීම (දමිළ මාධ්‍ය) | 50 | | | | |
| නීති බිඳින සහ නීතියට පටහැනි ළමුන් ආරක්ෂා කිරීම (සිංහල මාධ්‍ය) | 150 | | | | |
| නීති බිඳින සහ නීතියට පටහැනි ළමුන් ආරක්ෂා කිරීම (දමිළ මාධ්‍ය) | 50 | | | | |
| ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රවේශයන් | 150 | | | | |
| එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සහ අයිතිවාසිකම් ප්‍රවේශයන් | 140 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ළමුන් වෙනුවෙන් සිදුකරන කායික දණ්ඩනය | 150 | | | | |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කරනුයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කිරීමයි. විධිමත් පුහුණුවක් ලබාදීමෙන් ආයතනයේ නිලධාරින්ට තමා විසින් ඉටුකරනු ලබන කාර්යයන් වඩා ඵලදායිව සිදුකිරිමට හැකිවන අතර එමගින් ආයතනයේ කාර්යසාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබේ. එමගින් ආයතනයේ දැක්ම මෙහෙවර හා අරමුණු පහසුවෙන් ළඟාකර ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් එහි නිලධාරින් සඳහා ඉහත පරිදි පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මෙම වැඩසටහන් කොරෝනා වසංගතය හේතුවෙන් zoom තාක්ෂණය උපයෝගීකර ගනිමින් පවත්වන ලදී.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගතයුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)** | අනුකූල වේ (i) , (iii), ,(iv) භාවිතා (vi) කරයි | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි | | | |

| | | | | |
|---|---|---|---|---|
| | කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA — N20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | අනුකූල වේ | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | වේ අනුකූල | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | අනුකූලවේ | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | | අනුකූල නොවේ | පිළිතුරු සම්පූර්ණ වශයෙන් ලබාදී නොමැත .<br>නිසි දිනට පිළිතුරු ලබාදීම තුළින් විගණන විමසුම් පෙන්වාදීම් නිවැරදි කර ගැනීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | | අනුකූල නොවේ | කොවිඩ් 19 තත්ත්වය මත අපහරණ කටයුතු සිදු කිරීම ප්‍රමාද වීඇත. ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කරමින් පවතී |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු .රෙ. 772අනුව සිදු කිරීම | | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | | | |
| 9.2 | වාහන ගර්හිත වී 06 මාසකට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | | අනුකූල නොවේ | අනුකූල කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කෙරේ |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූලවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාරණය** | අනුකූලවේ | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | අනුකූල නොවේ | ඇතැම් අවස්ථාවල මාසයක කාලසීමාව ඉක්මවා ගොස් ඇත |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලවරුස් කළ , ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | | |
| 15.2 | රුස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| **16** | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කාර්යමණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | | අනුකූල නොවේ | ලබාදී ඇති රාජකාරී ලැයිස්තු යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | අනුකූලවේ | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | අනුකූල නොවේ | ඉදිරියේදී අනුකූල කර ගැනීමට කටයුතු කෙරේ |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම. ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා | | අනුකූල නොවේ | ඉදිරියේදී අනුකූල කර ගැනීමට කටයුතු කෙරේ |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | | අනුකූල නොවේ | පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදිකරමින් පවතී. විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු කඩිනමින් නිවැරදි කර ගැනීම හා ඉදිරියේදී වළක්වා ගැනීමට සුදුසු පියවර ගැනීම |